සිව් යහළු විකුම

# රිදී තැන්නේ අබිරහස



පී. බී. සේනානායක

# 1

"මේක මහ පාළු නගරයක් ' යි පෙරටුව ගමන් කළ පීටර් වීදියේ ඉහළත් පහළත් පිරික්සමින් කීවේ ය. "මෙහෙ ගත කරන නිවාඩුව ඒ හැටි ප්‍රීතිදායක වේ ය යි හිතන්ට බැහැ."

"ඒ කතාව ඇත්ත" යි ජැක් හිස සැලී ය. "මෙහෙම පාළු පළාතක අපි මාසයක් තිස්සේ මොනවා කරන්ට ද?"

"ඔව්" යි ඩික් නොසතුටු මුහුණින් එකඟතාවය පළ කළේ ය. "බිල් මොන එහෙකට අප මෙහෙම පළාතකට ගෙනාවද?"

"නමුත් අපට ඕනෑ නගරෙක නිවාඩුව ගත කරන්ට නොවේ." යි බිල් විරුද්ධ වී ය. "මම අහල තියෙන හැටියට මේ නගරෙට තරමක් ඈතින් උස් බිමක් හම්බ වෙනවා. එතන ඉඳල මුහුදු වෙරළ වෙනකම් ම තියෙන්නේ විශාල ගොහොරු බිමක්. මේ පළාතට ආවේනික පැලෑටිත් පක්ෂි වර්ගත් බොහොමයක් ඔය වගුරු බිමේ දකින්ට පුළුවන්ලු."



Scanned with CamScanner

"එහෙනම් අපට මුළු නිවාඩුව ම කුරුල්ලොත් පැලැටිත් බල බලා ඉන්ට වෙයි" යි ජැක් සිනහ පහළ කළේ ය.

"ඔව්. පසුගිය නිවාඩුවල වගේ කිසි ත්‍රාසජනක දෙයක් කරන්ට ලැබෙන්නේ නැහැ."

රටේ විවිධ ප්‍රදේශවල සංචාරය කරමින් පාසල් නිවාඩුව ගත කිරීම කලක සිට ම ඩික්, බිල්, පීටර් හා ජැක් යන සිව් මිතුරන්ගේ සිරිතක් ව පැවතිණ. ලන්ඩනයේ නිව් බේලි උසස් විද්‍යාලයේ එක ම පන්තියේ උගත් දක්ෂ, බුද්ධිමත් සිසුන් වන ඔවුන් මෙසේ සංචාරයන්හි නියැළුණේ කාලය නිකරුණේ විනාශ කිරීමට නොව නිවාඩුව අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රායෝගික ව යොදා ගැනීමේ අභිප්‍රායෙනි. විටෙක ඔවුහු මුහුදු බඩ පෙදෙසක නතර ව ජලජ ජීවීන් හා මුහුදු පැලැටි පිළිබඳ ව පර්යේෂණ කරති. නො එසේ නම් ධීවර ජනයාගේ ජීවන තොරතුරු රැස් කරති. තවත් විටෙක පැරණි නටඹුන් සහිත පෙදෙසකට ගොස් ඒවායේ ඓතිහාසික වටිනාකම සොයා බලති. නැතහොත් ඒ ඒ ප්‍රදේශවලට විශේෂිත වූ ජන ප්‍රවාද ආදිය එක් රැස් කරති.

සංචාරයේ යෙදුණු අවස්ථා ගණනාවකදී ම ඔවුන් ත්‍රාසජනක වික්‍රමවලට මුහුණ දුන්නේ අනපේක්ෂිත ව ය. නීතියට ප්‍රශ්නයක් වූ අබිරහස් සයක් විසඳීමෙන් ඔවුහු බලධාරීන්ට සහාය වූහ. ඒ වෙනුවෙන් මහත් පැසසුම් ද ලද්දෝ ය. මෙවර ඔවුන් සංචාරය සඳහා පැමිණියේ දකුණු එංගලන්තයේ වෙරළ තීරය ආසන්නයේ පිහිටි බේහිල් නමැති කුඩා නගරයට ය.

ඔවුහු යළිත් වරක් දුහුවිල්ලෙන් පිරී ගිය පාළු වීදිය ඉහළට ගමන් කරන්ට වූවෝ ය. මද දුරක් පසුවන තෙක් නගරය ජනාවාසිත බැව් හඟවන එක ද මිනිස් රුවක් හෝ ඔවුන් විසින් නොදක්නා



Scanned with CamScanner

ලදී. වීදිය දෙපසෙහි වූයේ දුර්වර්ණ බැම්මෙන් යුතු එකිනෙකට යා ව ඉදි කළ නිවාස දෙපෙළකි. සියල්ලක ම පාහේ දොර කවුළු වසා තිබිණ. හදිසියේ හමා ගිය මද සුළං රැල්ලක් හේතුකොටගෙන වීදියේ තැන්පත් වූ දූහුවිලි, වළාවක් පරිද්දෙන් නැගෙන්ට වූයෙන් දෙනෙත් වසාගෙන මද වේලාවක් නොසෙල්වී සිටීමට ඔවුන්ට සිදු විය. සිස් වූ රාක්ක කිහිපයකින් යුතු කුඩා වෙළඳ සලක් ඔවුහු පසු කළහ. එහි හිමිකරු මෙන් පෙනුණු පැසුණු රැවුලෙන් හෙබි මහල්ලෙක් හැඟීමෙන් මුක්ත අලස බැල්මක් ඔවුන් වෙත හෙළුවේ ය. වීදියේ වැතිර සිටි දිරාපත් බල්ලන් කිහිප දෙනෙක් කලකට පසු පැමිණි මේ ආගන්තුකයන්ගේ දර්ශනයෙන් තැති ගත්තාක් මෙන් ඔවුන් පසු පස යමින් බුරන්ටත් ගොරවන්ටත් වූහ. බල්ලන්ගේ ඝෝෂාව නිසාදෝ දොරටුවක් හැරගෙන පිටතට බට කාන්තාවක් දොරකඩ අසල සිට සිස් බැල්මෙන් ඔවුන් දෙස බැලුවා ය.

"සුභ උදෑසනක්" යි ප්‍රීතිමත් සිනහවක් පාමින් පීටර් ඇය ඇමතී ය.

"සුභ උදෑසනක්" යි පෙරළා මිමිණූ ස්ත්‍රිය ඔවුන් කිසිවක් විමසන්නට ද මත්තෙන් නිවසට වැදී යළි දොරටුව වසා ගත්තා ය.

"මේක පුදුම නගරයක් නොවැ" යි ඩික් සිනහ පහළ කළේ ය. "අපි දැක්කෙත් මිනිස්සු දෙන්නයි. ඔවුන්ගෙත් කිසි ආචාරශීලීත්වයක් නැහැ"

'අපට ලොකු කෑම අර්බුදයකට මුහුණ දෙන්ට වෙනවා" යි බැරෑරුම් මුහුණින් ජැක් සෙස්සන් දෙස බැලී ය. "ගෙනා කෑම අවසන් වුණාට පස්සේ මොනවද කරන්නේ? කෑම ගන්ට පුළුවන් තැනක් මේ නගරෙ නැති හැඩයි. දැක්කෙ නැද්ද? අර කඩේ තිබුණෙ හිස් රාක්ක විතරයි."



Scanned with CamScanner

"ඒ ගැන කරදර වෙන්ට වුවමනා නැහැ" යි බිල් ඔහු අස්වැසී ය. "නගරෙට තරමක් ඈතින් කුඩා ගොවි පොළවල් කිහිපයක් තියෙනවාලු. පානුත් කිරිත් බිත්තරත් අපට ඒ තැන්වලින් ගන්ට පුළුවනි."

උස් බිම දෙසට විහිදෙන රළු මගකින් නිවෙස් දෙපෙළින් යුතු පටු වීදිය කෙළවර වන බැව් ස්වල්ප වේලාවකින් ම පෙනී ගියේ ය. ඔවුහු එකී මගට අවතීර්ණ ව නොනැවතී පෙරට ම පා එසවූහ. මාවතට තරමක් ඈතින් තන් තන්හි විසිරුණු, කුඩා නිවෙස් කිහිපයක් ඔවුන්ට පෙනිණ. කිසිවකු නොපෙනුණ ද නිවෙස් තුළ දිවා ආහාරය පිසෙන බැව් හැඟවෙන දුම් කඳක් කවුළු තුළින් අහසට නැගුණේ ය. නිවෙස් සහිත පෙදෙස ඉක්ම වූ ඔවුහු ලඳු කැළයක් මැදින් වැටුණු රළු මග ඔස්සේ පියවර තැබූහ. සූර්ය රශ්මිය ක්‍රමයෙන් දැඩි වූ අතර ඔසවාගත් ගමන් මළුවල බරින් මැඩුණු සිරුරු දහඩියෙන් තෙත් වූයේ ය.

"ටිකක් විඩා හැරලා යමු.." යි මග අද්දර වැඩුණු විශාල ගසක් යට ගමන් මල්ල තබමින් ජැක් කීවේ ය. "මල්ල දැන් යකඩ වගෙයි දැනෙන්නෙ.."

සෙස්සෝ ද හදිසියේ ලද සෙවණ පිළිබඳ ව ස්තුතිපූර්වක ව ගමන් මළු පසෙක හෙළා බිම හිඳ ගත්තෝ ය.

"අරමුණක් නැති ව යන මේ ගමනේ ඇති ඵලේ මොකක්ද?" යි දහඩිය වැගිරෙන මුහුණ ලේන්සුවකින් පිස දමමින් පීටර් ප්‍රශ්න කළේ ය. "රෑ නවතින්ට තැනක් ගැනත් බලන්ට ඕනෑ"

"අරමුණක් නැත්තේ නැහැ" යි බිල් හරස් වී ය." මේ මග මම කලින් කිව්ව වගුරු බිමෙන් කෙළවර වන බව මට විශ්වාසයි.



Scanned with CamScanner

අපට ඒ අද්දර කූඩාරමක් හදාගන්ට පුළුවනි.''

''නමුත් එතනට තව කොයි තරම් දුරක් තියෙනවද කියල කව්ද දන්නෙ? රෑ වෙනකම් ඇවිද්දත් එහාට යන්ට බැරි වෙන්ට පුළුවනි. අහන්ට කෙනෙකුත් නැහැ නොවැ.''

ඔහු මෙසේ පවසන්නා හා ම තමන් ගමන් කරන දෙසට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණෙන කරත්තයක පට්ටම් සහිත රෝද රළු බිමෙහි ගැටෙන හඬ සවනත වැකිණ. තවත් මොහොතකින් ඈත නැම්මක් වටා මතු වූ කුඩා අස් රියක් සෙමින් සෙමින් ඔවුන් දෙසට ඇදෙනු පෙනුණේ ය.

''මේ කරත්තකාරයාගෙන් පාර අහන්ට පුළුවනි.'' යි බිල් හිඳ සිටි තැනින් නැගිට්ටේ ය.

''නමුත් අර ගෑණී වගේ මෙයත් ප්‍රශ්නයක් අහන්ට කලින් පැනල යයි ද දන්නේ නැහැ'' යි ජැක් තම සගයා හා එක් විය.

ළමෝ වහ වහා මාවත අද්දරට ගොස් රථය පැමිණෙන තෙක් බලා සිටියහ. එය, කුඩා හිස් වැස්මක් ද සිරුරට වැඩි විශාලත්වයකින් යුතු කබායක් ද හැඳි ගොවියකු මෙන් පෙනුණු මිනිසකු විසින් පදවන ලද රථයකි. එහි පසු කොටසේ ගැහැණියක් හා කුඩා ළමයෙක් ද හිඳ සිටියහ.

''නවතින්ට'' යි සන් කරමින් ජැක් මාවත දෙසට පයක් තැබූ අතර වික්ෂිප්ත බැල්මක් හෙලමින් මිනිසා ඔවුන් අබියස රථය නතර කළේ ය.

''අපි යන්නේ වගුරු බිමට'' යි ජැක් දැන්වී ය. ''එතනට

කොච්චර විතර දුරක් තියෙනවද?''

''හැතැප්ම තුනක්'' යි මිනිසා කෙටි පිළිතුරක් සැපයී ය.

''මේ පාර කෙළින් ම යන්නේ වගුරු බිමට ද?''

''නැහැ. මහළු ජෝගේ ගොවි පොළ ළඟින් හැරෙන්ට ඕනෑ.''

''හරි. එතකොට ඔය කියන මහළු ජෝගේ ගොවි පොළට කොයි තරම් දුරද?''

''හැතැප්ම දෙකක්''

''එතනින් හැරිල කෙළින් ම යන්නේ වගුරු බිමට ද?''

''ඔව්. ගුවන් හමුදා කඳවුර පහු කරන්ට ඕනෑ''

''ගුවන් හමුදා කඳවුර!''

''ඔව්. ගුවන් හමුදා කඳවුර''

තවත් මොහොතකුදු ප්‍රමාද නොවූ මිනිසා රථය පදවාගෙන පසු නොබලා යන්ට ගියේ ය.

''බොහොම ප්‍රීතිමත් සුහදශීලී චරිතයක්'' යි ඇත් ව යන රථය දෙස බලමින් ඩික් මදහසක් නැංවී ය. ''අපි ආවේ පිස්සන්ගේ රටකටද? නැතිනම් මුඩුමයන්ගේ රටකට ද?''

''මම කල්පනා කළෙත් ඒක ම තමා'' යි පීටර් එකඟ විය.



Scanned with CamScanner

"මෙහෙ ඉන්නෙ පුදුමාකාර මිනිස් වර්ගයක්."

"අර මිනිහ ගුවන් හමුදා කඳවුරක් ගැන කිව්වා නේද?" යි බිල් විචාළේ ය. "හරියාකාර පාරක්වත් නැති මෙහෙම පළාතක ගුවන් හමුදා කඳවුරක් තියෙන්නේ ඇයි?"

"ඒක නම් මටත් හිතාගන්ට බැහැ"යි ජැක් කල්පනාකාරී හඬින් පිළිතුරු දුන්නේ ය. "කිසි කෙනෙක් නොඑන වගුරු බිමකිනුයි කඳුවලිනුයි වටවුණු මෙහෙම තැනක ගුවන් හමුදා කඳවුරක් පිහිටුවන්ට හේතුව මොකක්ද?"

"අපි ගිහින් ම බලමු" යි පසෙක තබන ලද ගමන් මල්ල යළි උරයේ රඳවාගනිමින් ඩික් පැවසී ය. "දැන් හොඳට ම දවල් වුණා. තරමක බඩගින්නකුත් දැනෙනවා."

"දවල් කෑමට කලින් ඔය කියන වගුරු බිම සොයාගන්ට බලමු."

ඔවුහු යළිත් වරක් රළු මග ඔස්සේ පෙරට ම ගමන් කළෝ ය. බිම ක්‍රමයෙන් උස් ව නැගෙන බැව් ඔවුන්ට පෙනිණ. ලඳු කැලය කෙමෙන් තුනී වූ අතර නැවතී විඩා හළ හැකි එක ද විශාල වෘක්ෂයක් හෝ දැකගත නොහැකි වී ය. චණ්ඩ සූර්ය රශ්මිය ඔවුන්ගේ සිරුරු මැඩ සිටි විඩාව වර්ධනය කළේ ය. දෙපැයකින් පමණ ලඳු කැලය ඉක්ම වූ ඔවුහු පුළුල් ව පැතිරෙන සාරවත් තණ බිමින් යුතු කඳු ගැට සහිත පෙදෙසකට අවතීර්ණ වූහ.

"අන්න, අතනින් දුමක් පෙනෙනවා" යි තමන් අබියස වන කඳු බෑවුමෙන් අහසට නැගෙන දුම් කඳක් දක්වමින් බිල් කෑගැවේ ය. "අනුමානයක් නැහැ මහළු ජෝගේ ගොවිපොළ වෙන්ට ඕනෑ."



Scanned with CamScanner



* ප්‍රථමයෙන් නිවසක දුම් කවුළුවක් ද ඉක්බිති පහත වහළින් යුතු කුඩා නිවසක් ද දර්ශනය වී ය.

Scanned with CamScanner

වහලයක සෙවණ අපේක්ෂාවෙන් ගත තවන විඩාව මදකට බැහැර කළ ඔවුහු දුම් කඳ දක්නා ලද බෑවුම දෙසට වහ වහා පා එසෙව්වෝ ය. ප්‍රථමයෙන් නිවසක දුම් කව්ළුවක් ද ඉක්බිති පහත් වහළින් යුතු කුඩා නිවසක් ද දර්ශනය වී ය. නිවස පිටුපස දඬු වැටකින් ආවරණය වූ කුඩා බිමක අශ්වයන් තිදෙනෙක් බැඳ දමා සිටියහ. නිවස ඉදිරිපිටත් අසල කඳු බෑවුමේත් ගවයන් රංචු ගැසී තණ කමින් නිදල්ලේ හැසිරෙනු ඔවුන්ට පෙනිණ. නිවසට තරමක් ඈතින් කුකුළන් රැඳවීම සඳහා ඉදි කළ තරමක් විශාල කුඩුවක් වූයේ ය.

"අපි ගිහින් බලමු." යි පීටර් පෙරමුණ ගත්තේ ය. "එහාට ගියොත් අඩු තරමින් මේ ගිනි ගහණ අව්වෙන් තාවකාලික ව හෝ ගැළවෙන්ට පුළුවනි."

"මහළු ජෝත් අපට මුණ ගැසුණු අතික් අය වගේ ම මුඩුමයෙක්ද දන්නේ නැහැ" යි ජැක්, නිවස වෙත සැකය මිශ්‍රිත බැල්මක් හෙළී ය. "එහෙම නම් එතනට ගිහින් අපි කරන්නේ මෝඩකමක්".

"කමක් නැහැ, ගිහින් බලමු."

ඔවුහු බෑවුම බැස නිවසට සේන්දු වූවෝ ය. එය ගඩොලින් බැඳි පැරණි ගොඩනැගිල්ලක් බැව් වඩා ආසන්න වූ පසු ඔවුන්ට පෙනිණ. මිදුලේ වැතිර සිටි බල්ලෙක් ළමුන්ගේ පා හඬ අසා හිස ඔසවා කිහිප වරක් බිරුවේ ය. නිවසේ විවෘත ආලින්දයේ එක් අන්තයක දුර්වර්ණ වූ පුටු කිහිපයක් පෙළට තබා තිබිණ.

"ගෙදර කව්ද?" යි ළමෝ මිදුලේ සිට උස් හඬින් කෑගැහ.



Scanned with CamScanner

තවත් මොහොතකින් නිවසේ ඉදිරි දොරටුව විවෘත ෑ මදක් කුදු ගැසුණු වයසක මිනිසෙක් ආලින්දයේ සිට ඔවුන් දෙස විමසිලිමත් බැල්මක් හෙළී ය.

"ඔය ළමයි කව්ද?" යි ඉක්බිති හෙතෙම තියුණු දකුණු එංගලන්ත උච්චාරණයක් මිශ්‍රිත ස්වරයෙන් විචාළේ ය.

"අපි ලන්ඩනයෙන්" යි ජැක් පිළිතුරු වශයෙන් කී ය. "ආවේ වගුරු බිමේ පාසල් නිවාඩුව ගත කරන්ට."

"හා! එහෙනම් සංචාරකයෝ" යි මහල්ලා රත් ගැසුණු දත් දෙපෙළක් විදහමින් සිනහ පෑවේ ය. "නමුත් නිවාඩුව ගත කරන්ට මේ තරම් දුෂ්කර පළාතක් තෝරාගත්තේ ඇයි?"

"එහෙම පළාත්වල ඇවිදින්ට අපි කැමතියි" යි පීටර් කථාවට එක් විය.

"බොහොම හොඳයි, බොහොම හොඳයි. නමුත් අවුරුදු ගණනකින් අමුත්තො මේ පළාතට ආවමයි, ඔය"

"කව්ද ඔය කථා කරන්නේ?" යි ගැහැණියකගේ හඬ මේ මොහොතේ නිවස තුළින් ශ්‍රවණය වී ය.

"මේ ලන්ඩනයේ ළමයි වගයක්" යි විවෘත දොරටුව දෙසට හැරෙමින් මහල්ලා උස් හඬින් පිළිතුරු දුන්නේ ය. "නිවාඩුව ගත කරන්ට අපේ පළාතට ඇවිත්"

තවත් මොහොතකින් මහල්ලා තරමට ම වයස් ගත ය යි සිතිය හැකි ගැහැණියක් ආලින්දයට ප්‍රවිෂ්ඨ ව මද සිනහවක් ගැබ්



Scanned with CamScanner

වූ මුහුණින් ළමුන් දෙස බැලුවා ය.

"හා! දැන් හොඳට ම දවල් වෙලා. මේ ළමයි තව ම කෑම කාලත් නැති ව ඇති. අනික, ටවුමේ ඉඳල පයින් ම නොවැ, එන්ට ඇත්තේ, මේ කට්ට දවාලෙ"

"අපට ඒ හැටි බඩගින්නක් නැහැ" යි තම සගයන් දෙස බලා ඇසක් ඉඟි මරමින් බිල් පිළිතුරු දුන්නේ ය.

"නැති වෙන්නේ කොහොමද?" යි ගැහැණිය කෝප වූ බවක් හැඟෙව්වා ය. "හා හා, තියෙන හැටියකට කෑම කාලා කථා කරමු"

ළමෝ විස්මිත මුහුණින් එකිනෙකා දෙස බැලූහ. මහළු ජෝ හා ඔහුගේ බිරිඳ පෙර හමු වූ මිනිසුන් මෙන් නොව අතිශයින් මිත්‍රශීලී බැව් ඔවුන්ට ක්ෂණයකින් අවබෝධ විය. ගත තවන උණුසුම් තාපයෙන් මදකට හෝ ගැළවෙන්ට ලැබීම පිළිබඳ ව මහළු දෙමහල්ලන්ට ස්තුති කළ ඔවුහු එතෙක් ඔසවාගෙන සිටි ගමන් මළුවල බරින් මිදුණෝ ය. ඉක්බිති ජෝ මහත්මියගේ විධානය පරිදි මුහුණ කට සෝදාගෙන දෙමහල්ලන් ද සමඟ උණුසුම් දිවා භෝජනයක් සඳහා හිඳගත්තෝ ය.

"ඔය දරුවන්ට නිවාඩුව මේ ගොවි පොළේ ම ගත කරන්ට පුළුවන් නොවැ" යි දිවා ආහාරයෙන් ඉක්බිති දුම් පයිප්පයක් දල්වාගත් මහල්ලා දුම් වළාවක් අහසට මුදා හළේ ය.

"නැහැ. වගුරු බිම කිට්ටුව කූඩාරම හදාගෙන නිවාඩුව එහෙ ගත කරන්ට අපි වඩාත් කැමතියි" යි දෙමහල්ලන්ගේ සිත් නොතැලෙන පරිද්දෙන් ජැක් කී ය.



Scanned with CamScanner

"දැන් ළමයින්ට තියෙන්නේ අපූරු විනෝදාංශ නොවැ" යි ජෝ මැතිණිය මදහසක් නැංවූවා ය. "කොහොම වෙතත් කමක් නැහැ. කිරි, බිත්තර වගේ දේ ඕනෑ වුණා ම මෙහාට එන්ට"

"හොඳයි" යි ළමෝ හිස් සැළුහ.

"වගුරු බිමේ ඇවිදින්නේ ප්‍රවේශමෙන්" යි මහළු ජෝ අනතුරු ඇඟවී ය. "සමහර තැන් වියළි ව තිබුණත් යටින් ඇත්තේ මෘදු මඩ තට්ටුවක්. අඩිය තිබ්බොත් ගැළවෙන්ට බැරි තරමට ම ගිලෙයි. මගේ හරකුන් කිහිප දෙනෙක් ම ඔහොම තැන්වලට අහුවෙලා සම්පූර්ණයෙන් ම නොපෙනී ගියා."

"හොඳයි, අපි ප්‍රවේශම් වෙන්නම්" යි ළමෝ ගිවිසියහ.

ඔවුන් මෙසේ සංවාදයේ යෙදී සිටින අතරතුර ඉතා පහතින් පියාසර කරන හෙලිකොප්ටරයක හඬ ඔවුන්ගේ සවනත වැකිණ.

"ඒ මොකක්ද?" යි ජැක් විස්මිත බැල්මක් හෙළී ය. "හෙලිකොප්ටරයක් වගෙයි ඇහෙන්නේ"

"ඔව්. ගුවන් හමුදා කඳවුරේ හෙලිකොප්ටරේ" යි මහල්ලා පිළිතුරු දුන්නේ ය.

"ආ! ඔය ගුවන් හමුදා කඳවුර ගැන අහන්ට අපට අමතක වුණා" යි පීටර් කී ය. "ඇයි මෙහාට ඔහොම කඳවුරක්?"

"ඒක කියන්ට දන්නේ නැහැ. හතර පැත්තෙන් ම වැටවල් ගහලා ආවරණය කරලයි ඔය කඳවුර තියෙන්නේ. කිසි කෙනෙකුට ඇතුළට එන්ට දෙන්නේ නැහැ. ඔය කඳවුරේ ප්‍රධානියා වතාවක්

මෙහාටත් ආවා. මේ ගේ තියෙන ඉඩම රජයේ දේපොලක්ලු. අපි මෙහෙ ඉඳීම හමුදා කඳවුරේ ආරක්ෂාවට තර්ජනයක්ලු. ඒ නිසා අපට ගේ අත් හැරලා යන්ට ය කිව්වා."

"ඉතින්"

"නමුත් මම බැහැ යි කිව්වා. පරම්පරා ගණනක් අපි ජීවත් වුණු මේ ගොවි පොළ රජයේ දෙයක් වෙන්නේ කොහොමද? මම එයාට කිව්වා ඕනෑ නම් නඩු දාන්ට ය කියලා."

"'ඊට පස්සේ?" යි ළමෝ උද්යෝගයෙන් ප්‍රශ්න කළහ.

'දම්ම නඩුවක් නැහැ. පස්සෙ මිනිහා ආපහු ඇවිත් මේ ගේත් ඉඩමත් සල්ලිවලට අරගෙන කඳවුරට පවරාගන්ට කැමතියි කිව්වා. ඉල්ලන මුදලක් දෙන්නම් ය කියලත් කිව්වා. නමුත් මම කැමති වුණේ නැහැ. සල්ලි අරගෙන අපි කොහේ කියල යන්ට ද මේ පුරුදු පරිසරය අත් හැරලා. ඔය සිද්ධියට පස්සේ නම් එයා අපට කරදර කරන්ට ආවේ නැහැ."

"මේක බොහොම පාළු පළාතක් නොවේ ද?" යි මහල්ලාගේ කථාවට සවන් දී සිටි ජැක් ප්‍රශ්න කළේ ය.

"ඔව්. නමුත් දැන් මෙහෙම තිබුණට එක කාලෙක රිදී තැන්න බොහොම ජනාකීර්ණ තැනක්"

" රිදී තැන්න!"

"ඔව්. මෙහාට කියන්නේ රිදී තැන්න ය කියලයි"



Scanned with CamScanner

"අපූරු නමක් නොවැ. ඇයි එහෙම නමක් දමලා තියෙන්නේ?"

"හා, ඒක රසවත් කථාවක්. බොහොම කාලෙකට ඉස්සර මෙහාට ආ කෙනෙකුට කඳු බෑවුමක තිබිලා රිදී කුට්ටියක් සම්බවෙලා තියෙනවා. තවත් සොයල බලද්දි එයාට තේරුණා රිදී ඉල්ලමක් මෙහෙ තියෙන බව. ඔය ආරංචිය පැතිරුණාට පස්සෙ රටේ නොයෙක් පළාත්වල මිනිස්සු රිදී සාරන්ට මෙහාට ආවා. වැඩි දෙනෙක් ආවේ ගම් පළාත්වල ඔවුන්ගේ ගෙවල් දොරවල් පවා විකුණලා. මේ මිනිස්සු පැල්පත් අටවාගෙන රිදී හොයන්ට පටන් ගත්තා. රිදී තැන්න කියන නම වැටුණේ ඔහොමයි. රිදී සොයාගෙන කොයි තරම් සෙනඟක් ආවද කියනවා නම් ඔවුන් එක්ක ගනුදෙනු කරන්ට වෙළෙන්දොත් මෙහෙ එන්ට පටන් ගත්තා. බේහිල් නගරය පිහිටෙව්වේ ඔවුන්. රිදී සොයන්නන්ට අවශ්‍ය කෑම බීම උපකරණ වගේ දේවල් ඔවුන් විකුණුවා. ඉක්මණින් ම නගරය බොහොම සශ්‍රික වුණා. නමුත් අවාසනාවකට වගේ හිතූ තරම් විශාල රිදී ඉල්ලමක් මෙහෙ තිබිලා නැහැ. මුලින් ම ආ කිහිප දෙනෙකුට විතරයි රිදී සම්බ වුණේ. ඉතිරි අයට කිසි ම දෙයක් ලැබුණේ නැහැ. ඊට පස්සෙ බොහොම දෙනෙක් පළාත අත් ඇරලා යන්ට ගියා. ඉතිරි අයට යන්ට තැනක් තිබුණේ නැහැ. ඇයි? ගමේ ගෙවල් දොරවල් විකුණලා නොවැ ආවේ. ඉතින් ඔවුන් බේහිල් නගරයෙත් ඒ අවටත් පදිංචි වුණා. වෙළ හෙළඳාම් පහත වැටෙන්ට පටන් ගත්තට පස්සෙ නගරයේ වෙළෙන්දොත් යන්ට ගියා. ඒ නිසා එතෙක් සශ්‍රික ව තිබුණු නගරෙත් පාළු වුණා. අපේ සීයාත් රිදී සොයන්ට මෙහෙ ආ කෙනෙක්. නමුත් එයා ආපසු ගමට ගියේ නැහැ. මෙතන ගෙයක් හදාගෙන බැටළුවන් ඇති කරන්ට ගොවි පොළක් පටන් ගත්තා. එයාගෙන් පස්සේ මගේ තාත්තත් දැන් මමත් ගොවිපොළ පවත්වාගෙන යනවා. බේහිල් නගරයත් රිදී තැන්නත් දැන් තනි වෙලා. බාහිර ලෝකෙ එක්ක අපේ වැඩි සම්බන්ධයක් නැහැ. රජයේ නිලධාරියෙක් මේ කිට්ටුවකටවත් එන්නේ නැහැ. ලියුම් පත්තර වගේ කිසි ම

දෙයක් මෙහාට ලැබෙන්නේ නැහැ. කෙටියෙන් කියනවා නම් රටේ ලෝකෙ සිද්ධ වෙන කිසි ම දෙයක් අපි දන්නේ නැහැ. ලන්ඩනයත් එක්ක තියෙන එක ම සම්බන්ධය දවසකට වතාවක් බේහිල් නගරයේ නතර කරන දුම්රිය විතරයි."

මේ වන විට මධ්‍යහ්නය පසු වී තිබුණෙන් සූර්ය තාපය සැලකිය යුතු පමණ හීන ව තිබිණ. කරන ලද සංග්‍රහයන් වෙනුවෙන් දෙමහල්ලන්ට ස්තුති කළ ළමෝ ගමන් මළු ද ඔසවාගෙන වගුරු බිම සොයා. ගමනාරම්භ කළෝ ය.

"අපේ මුණුබුරා, ජිම් හිටියා නම් පාර පෙන්නන්ට එවන්ට තිබුණා" යි ඈත් ව යන ළමුන් දෙස බලමින් මැහැල්ල කීවා ය. "උදේ බැටළුවන් දක්කගෙන ගියාට පස්සෙ තව ම ආපහු ආවෙ නැහැ."

මහළු ජෝ විසින් දක්වන ලද මග ඔස්සේ ඔවුහු කඳු ගැට නගිමින් ද පල්ලම් බසිමින් ද නොනැවතී ගමන් කළෝ ය. සන්ධ්‍යාව එළඹ තිබුණෙන් සූර්ය තාපය පහ වී සිසිල් මඳ සුළඟක් කඳු ගැට සිසාරා හැමී ය. දහවලදී තරම් වෙහෙසක් නොදැනුණෙන් වේගයෙන් ගමන් කළ ඔවුහු අසම බිමේ අවසාන කඳු ගැටය ද තරණය කොට එහි පාමුල සිට විහිදෙන අති මනස්කාන්ත වූ භූමි භාගය ප්‍රථම වතාවට දර්ශනය කළාහ.

ඒ නම් සැබැවින් ම සිහින ලෝකයක බඳු අති සුන්දර ස්ථානයකි. කඳු පාමුල සිට ඈත වගුරු බිම දක්වා විහිදෙන තැනි තලාව නා නා වර්ණයේ පුෂ්පයන් පිරි ශාකයෙන් ගැවසී ඇත. තැනි බිමේ තන් තන්හි රංචු ගැසී අලස ඉරියව්වෙන් තණ උලා කන බැටළුවෝ සුදු පැහැති පුළුන් ගුලි මෙන් පෙනෙති. තැනි තලාව මැදින් ගලා බස්නා තරමක් පුළුල් දොළ පහරේ ශාන්ත දිය



Scanned with CamScanner

ගැබ බැස යන හිරුගේ රන්වන් පැහැයෙන් දිලෙයි. ඉවුරු සුදු පැහැති මලින් යුතු පහත් පඳුරු විශේෂයකින් වැසී ඇත. සැලෙන උස් පත් පඳුරින් යුතු වගුරු බිමකින් තැන්න කෙළවර වෙයි. ශාන්ත දියෙන් යුතු දොළ පහර වගුරු බිමට වැදී නොපෙනී යන අයුරු ළමුන් සිටි තැනට මැනවින් පෙනෙයි. වගුරට ඔබ්බෙහි ක්ෂිතිජයට තරමක් පහතින් නිල් පැහැති දියෙන් යුතු මහ සයුර යන්තමින් දර්ශනය වෙයි. ඒ නම් සැබැවින් ම දක්ෂ සිත්තරෙකුගේ තෙලි තුඩින් නිම වූ අති මනස්කාන්ත දසුනක් වූයෙන් ළමෝ මද වේලාවක් තිහඬ ව එකී චමත්කාරය නෙතින් ද සිතින් ද ග්‍රහණය කළෝ ය.

"කුඩාරමක් හදාගන්ට අපූරු තැනක්" යි ඩික් ප්‍රීතියෙන් කෑගැවේ ය. "වුවමනාවට වඩා වගුරට කිට්ටු වෙන්ට හොඳ නැහැ. මදුරුවන්ගෙනුත් වෙනත් කෘමීන්ගෙනුත් කරදර ඇති වෙන්ට පුළුවනි."

බෑවුම බසින්ට වූ ඔවුහු ස්වල්ප වේලාවකින් ම දොළ පහරට දකුණු පසින් වූ තැනිතලා බිමකට ප්‍රවිශ්ය වූවෝ ය.

"කුඩාරමට මෙතන හොඳයි" යි බිල් ගමන් මල්ල ගසක් යට බිම තැබී ය. "දොළ පාරට වැඩි ඈතකුත් නැහැ"

තමන් විසින් ගෙනෙන ලද කුඩාරම දිග හැර අටවාගත් ඔවුහු දොළෙන් ඇඟ පත සෝදාගෙන රාත්‍රිය එළඹෙන තෙක් විවිධ දෑ පිළිබඳ ව සාකච්ඡා කරන්ට වූවෝ ය.

"අර ගුවන් හමුදා කඳවුර අපි දැක්කේ නැහැ" යි ජැක් සෙස්සන් දෙස බැලී ය. "මොකක්ද ඔය කඳවුර ගැන හිතන්නෙ?"



Scanned with CamScanner

"මට නම් කිසි දෙයක් හිතාගන්ට බැහැ" යි පීටර් නළල රැළි ගැන්වී ය. "මේ පාළු පළාතට හමුදා කඳවුරක් මොකට ද?"

"වෙනත් රටක් එංගලන්තෙ ආක්‍රමණය කරන්ට යන බවට සැකයක් ඇති වෙලා ඔත්තු බලන්ට ඔය කඳවුර පිහිටෙව්වා වෙන්ට බැරිද?" යි ඩික් අදහසක් පළ කළේ ය.

"සමහර විට වෙන්ට පුළුවනි. නමුත් එහෙම ආක්‍රමණයක් ගැන හිතන්ටවත් පුළුවන් ද?"

"මහළු ජෝ්ගේ ඉඩම කඳවුරට පවරාගන්ට උත්සාහ කළේ ඇයි.? බලහත්කාරයෙන් ගන්ට බැරි වුණා ම සල්ලිවලට ගන්ට හැදුවා."

"අපි හෙට ඔය කඳවුර බලන්ට යමු" යි බිල් යෝජනා කළේ ය.

"නමුත් ඒ කිට්ටුවට කිසි කෙනෙකුට යන්ට දෙන්නේ නැතිලු"

"කෝකටත් අපි ගිහින් බලමු."

අඳුර වැටෙන්නට මොහොතකට මත්තෙන් රාත්‍රී ආහාරය අනුභව කළ ළමෝ තවත් ස්වල්ප වේලාවක් කූඩාරම ඉදිරිපිට දල්වන ලද ගිනි මැලයක් වටා හිඳ සල්ලාපයේ යෙදුණාහ. දූපත ලෝකය මුළුමනින් පහ ව ගොස් රාත්‍රී අන්ධකාරය පැතිරිණ. ක්‍රමයෙන් මුදුන් වූ චන්ද්‍රයාගේ ආලෝකයෙන් තැනිතලාවත් වගුරු බිමත් නැහැවී ගියේ ය. මඳ පවනේ හිස් නමමින් සැලෙන පන් පඳුරු අතරින් නිශාචර පක්ෂීන් කිහිප දෙනෙක් අහසට නැංගාහ.

චන්ද්‍රයාගේ තනිය මකාළන්නට මෙන් අහසේ තන් තන්හි තාරකා කිහිපයක් මතු විය. පුළුන් ගුලි වන් සුදු වළා කැරළි සුළඟේ වේගය හා එක් ව දකුණු දෙසට පා වී ගියේ ය.

"මට නම් හොඳට ම නිදිමතයි." යි ජැක් නැගී සිටියේ ය. "දැන් නිදාගමු"

දෙවැනි ආරාධනයත් අවශ්‍ය නොවී ය. විඩාපත් ගතින් යුතු ළමෝ ජැක් පිටුපසින් කූඩාරමට වැද ඉක්මනින් ම නින්දට වැටුණෝ ය.

## 2

තමා වටා බිම දෙදරන්නාක් මෙන් හදිසියේ දැනී ගියෙන් වහා අවදි වූ බිල් හිස මදක් ඔසවා අවට පිරික්සී ය. තමා අසල සුව නින්දේ පසු වන සගයන්ගේ අඳුරු ඡායාව යන්තමින් පෙනුණු මුත් දෙදරීමක සලකුණකුදු ඔහුගේ නෙත නොගැටිණ. දෙදරීම දැනුණේ සිහිනයෙන් විය හැකි ද යි ඔහු මදක් සිතී ය. එහෙත් ඒ එවැන්නක් නොවන බැව් ඔහුට ප්‍රත්‍යක්ෂ ය. කෙසේ වුව ද දෙදරුමට හේතු වූ කාරණා පිළිබඳ තව දුරටත් සිත වෙහෙසීමට විධාපත් ගත අවසර නොදුන්නෙන් ඔහු යළිත් වරක් හිස බිම ඔබා ගත්තේ ය. පෙරට වඩා පැහැදිලි ලෙස ඔහුට දෙදරුම යළි දැනිණ. එය පොළොවේ ගැඹුරින් නැගෙන්නාක් මෙන් ඔහුට දැනී ගියේ ය. එහෙත් හිස එස වූ පසු දෙදරීම ද නතර විය. යළි හිස බිම තැබූ විට දෙදරුම දැනිණ. තමාට කිසි අසනීපයක් වැළඳී ඇතැ යි ඔහු බිය විය. ඔහු හිස අල්ලා බැලුවේ ය. එය මදක් සෙළවී ය. යළි පොළොවට නැඹුරු විය. හිසේ දෝෂයක් විය නොහැකි ය. දෙදරුම පෙර ලෙසින් ම යළිත් වරක් ඔහුට දැනුණේ ය. ඒ පොළොවේ ඉතා ගැඹුරින් නැගෙන්නා වූ ක්‍රමවත් චලනයකි.



Scanned with CamScanner

"ගිනි කන්දක් වෙන්ට පුළුවන්ද?" යි ඔහු තමාගෙන් ම අසා ගත්තේ ය. තරමක බියක් ඔහුගේ සිත තුළට පිවිසිණ. තමන් සිටින්නේ ගිනි කන්දක් ආශ්‍රිත බිමක විය හැකි ය. එහෙත් තම රටේ ගිනි කඳු ඇති බැව් ඔහු කිසි කලෙකත් අසා නැත. ඒ නම් තරමක සැනසිල්ලකි. එතෙකුදු වුව ව්‍යාකූල සිතින් යුතු ව ඔහු කැ ගසා සෙස්සන් අවදි කළේ ය.

"ඇයි? ඇයි? " යි නිදි බර දෙනෙත් පිස දමමින් ජැක් කලබලයෙන් ඇසී ය. "මොකක්ද ප්‍රශ්නේ?"

"ඔළුව බිමට තියලා බලන්ට. දෙදරීමක් පොළොව යටින් නැගෙනවා. ඒක එහෙම නොවෙයි නම් මට අසනීපයක් හැදීගෙන එනවා වෙන්ට ඕනැ."

"ඔව්." යි තත්පර කිහිපයක් හිස පොළොවට තෙරපාගෙන සිටි ඩික් කීවේ ය. "බොහොම ගැඹුරින් නැගෙන දෙදරීමක්."

"මටත් දැනුණා" යි ජැක් හා පීටර් එක් හඬින් එකඟතාවය පළ කළහ.

"ඉතින් ඒ මොකක් වෙන්ට පුළුවන් ද?" යි ඩික් නළල රැළි ගැන්වී ය.

"ගිනි කන්දක්" යි පීටර් අදහසක් පහළ කළේ ය.

"මටත් ඕක මුළින් හිතුණා. නමුත් මෙහෙ ගිනි කඳු තියෙන බවක් මම කවදාවත් අහලා නැහැ."

"ඒක ඇත්ත. නමුත් මුහුදේ තියෙන ගිනි කන්දක මුල් මේ



Scanned with CamScanner

ප්‍රදේශයේ පොළොව යටින් විහිදෙනවා ද කියලා කව්ද දන්නේ?"

"මේ අවට මුහුදේ ගිනි කඳු තියෙන බවට කිසි කාලෙක වාර්තා වෙලා නැහැ"

"සමහර විට පොළොව යට කැළඹීමක් වෙන්ට පුළුවනි. භූමිකම්පාවක් වගේ දෙයක් වෙන්ටත් පුළුවන්"

"භූමි කම්පාවක් නම් ඒක පවතින්නේ ටික වෙලාවකටයි. නමුත් දැන් මිනිත්තු කිහිපයක් තිස්සේ ඔය දෙදරීම ඇහෙනවා නොවැ" යි බිල් හරස් වී ය.

"ඔව්. කිසි ම වෙනසක් නැති ව දෙදරීම තවමත් දැනෙනවා" යි යළිත් වරක් හිස පොළොවට නැඹුරු කොටගෙන සිටි ජැක් එකඟ වී ය.

"දැන් ඔය ගැන තර්ක කරලා වලක් නැහැ" යි ඩික් කීවේ ය. " ටිකක් නිදා ගන්ට බලමු."

"ඇස් දෙක පියාගෙන ඔළුව බිම තියන්ට බයයි" යි පීටර් මදහසක් නැංවී ය. "නින්ද ගියාට පස්සේ ගිනි කන්ද පොළොව යටින් පිපිරිලා අපි හැමෝ ම උඩ විසි වුණොත්"

"උඩ ගියොත් ආපහු බිම වැටෙයි. දැන් කැනොගහ නිදාගන්ට" යි දෙදරුම නොදැනෙන පරිද්දෙන් හිසත් පොළොවත් අතරින් ගමන් මල්ලක් තබමින් ජැක් උපදෙස් දුන්නේ ය. ගිනි කඳු සීයක් පිපුරුණත් හෙට එළිවෙනකම් මම නිදාගන්නවා."



Scanned with CamScanner

* * * * *

පසු දින උදෑසන ළමුන් අවදි වන විට සූර්‍ය්‍ය ඈත ක්ෂිතිජය ඉක්මවා නැගී තිබිණ. වගුරු බිමත් තැනිතලාවත් එහි රැසින් එක සේ නැහැවිණ. රාත්‍රිය පුරා ඇද හැළුණු පින්නෙන් තෙත් වූ තණ පත් සූර්‍ය්‍යාලෝකය වැද මිණි කැට මෙන් දිළිණ. තැනි බිම හරහා ගලන දොර පාර දිස් වූයේ පුළුල් රිදී කදම්බයක් පරිද්දෙනි. දොළ අසබඩ වැඩුණු මල් පඳුරු ප්‍රාණය ලද්දවුන් මෙන් නොනැවතී හමන අළුයම් සුළඟින් සැළුණේ ය. ඈත වගුරු බිමේ නැවී නැවී සැලෙන උස් තණ පඳුරු අඛණ්ඩ මුහුදු රළක් මෙන් පෙනිණ. මල් ගොමු අතර සරන පක්ෂීන්ගේත් බිඟුන්ගේත් නාදය සවනට ප්‍රිය ය.

කූඩාරම අබියස හිඳ පරිසරයේ චමත්කාරයෙන් වශී වූවන් පරිද්දෙන් බොහෝ වේලාවක් ගත කළ සිව් මිතුරෝ දොළෙන් මුහුණු සෝදාගෙන උදෑසන ආහාරය අනුභව කළෝ ය.

"ඊයෙ රෑ දැනුණු දෙදරීම ගැන හිතෙන්නේ මොකක් ද?" යි ජෑම් තවරන ලද පාන් කැබැල්ලක් මුව තුළ රුවාගනිමින් ජැක් සෙස්සන් දෙස බැලී ය.

"ඒ ගැන මට සම්පූර්ණයෙන් ම අමතක වුණා" යි පීටර් කීවේ ය. "හැබැට ඒ මොකක් වෙන්ට පුළුවන්ද? පොළොව යටින් ගලන දොළ පාරක් ද?"

"දැන් ඒ දෙදරීම දැනෙන්නේ නැහැ" යි මොහොතක් පොළොවට තැඹුරු වී සිටි ඩික් කී ය. "දොළ පාරක් නම් ඒක තවමත් ඇහෙන්ට එපායැ."

'මම නම් හිතන්නෙ ඒ පොළොව යට කැළඹීමක් නිසා ඇති



Scanned with CamScanner

වුණු දෙදරීමක් බවයි. ඒ හැරෙන්ට වෙනත් සාධාරණ හේතුවක් හිතාගන්ට බැහැ. ඔහොම කැළඹීම් විටින් විට පොළොව යට ඇති නොවෙන්ට හේතුවක් නැහැ."

"සමහර විට එහෙම වෙන්ටත් පුළුවනි" යි එකඟතාවය පළ කරමින් ජැක් හිස සැලී ය. "පොළොව යට හටගන්නා කැළඹීමක පීඩනය මතු පිටින් පිට වෙන්ට ම ඕනෑ ය කියල නියමයක් නැහැ"

"හොඳයි ඕක දැනට අමතක කරමු." යි පීටර් පැවසී ය. "අද අපි මොකක්ද කරන්නේ.?"

"වගුරු බිමේ ඇවිදින්ට යමු" යි ඩික් යෝජනා කළේ ය.

එය සියල්ලන්ගේ ම සිත් ගත් යෝජනාවක් සේ පෙනී ගියෙන් වහ වහා ආහාරය නිම කළ සිව් මිතුරෝ පිහන් කෝප්ප සෝදා කුඩාරමෙහි තැන්පත් කොට තැනිතලාව පහතට ගමන් කරන්ට වූවෝ ය.

උස් ව වැඩුණු තෘණ ගාලක ලැග සිටි සාවෙක් ඔවුන්ගේ පා හඬින් කලබල වී විශාල රුක් ගොමුවක් තුළට වැදුණේ ය. බ්ලැක්බෙරි පඳුරක වසා සිටි නිල් පියාපතින් යුතු පක්ෂි රැනක් බියපත් හඬක් නගමින් අහසට පියෑඹී ය. තණ කමින් සිටි බැටළුවකු ඇල්ලීමට පීටර් තැත් කළ ද ඔහුගේ ග්‍රහණයෙන් මිදී උෟ රැළේ සෙස්සන් ද සමඟ ඈතට පලා ගියේ ය.

කුඩාරම පිහිටි ඉසව්වට වඩා වගුරු බිමට ආසන්න වත් ම දොළ පාර ක්‍රමයෙන් පුළුල් ද ගැඹුරු ද වන බැව් පෙනුණේ ය. එහි පළිඟු වන් පැහැදිලි දියෙහි කුඩා හා විශාල මත්ස්‍ය රැන් ගණනාවක්



Scanned with CamScanner

එකිනෙකා මත හැපෙමින් පීනූහ. ඒ ට්‍රවුට් මසුන් විය හැකැ යි ජැක් අනුමාන කළේ ය. "මිනිස්සු නොඑන පරිසරයක් නිසා හොඳයි. නැතිනම් විනෝදෙට මාළු බාන්නන්ගෙන් මේ මාළුන්ට බේරුමක් නැති වෙයි."

"මම නම් විනෝදෙට මාළු බාන්ට කැමති නැහැ." යි පීටර් කීවේ ය. "මිනිස්සුන්ට විනෝදයක් වුණාට මාළුන්ට ඒකෙන් ලැබෙන විනෝදයක් නැහැ."

"ඔව්. මහ පව්කාර ක්‍රීඩාවක්" යි බිල් එකඟ වී ය.

"මේ දොළ පාර ගැන නගරෙ මිනිසුන්ට දැනගන්ට ලැබුණොත් මේ මාළුන්ට දෙවියන්ගෙ ම පිහිට තමා" යි ජැක් සිනා පහළ කළේ ය. "කොයි තරම් ඈතක ඉඳල වුණත් මිනිස්සු මෙහෙ එයි."

රුක් ගොමුවල පිබිදී හිනැහෙන නා නා වර්ණයේ පුෂ්පයන්ගේ සුවඳ ආඝ්‍රාණය කරමින් ද ඔබ මොබ සරන පක්ෂීන්ගේ මිහිරි ගී රාවය සවනින් උකහා ගනිමින් ද දොළ ඉවුර ඔස්සේ ගමන් කළ ඔවුහු නොබෝ වේලාවකින් ම වගුරු බිම අද්දරට පැමිණියෝ ය.

බැලූ බැල්මට ඒ තෙරක් නොපෙනෙන අති පුළුල් ගොහොරු බිමකි. උස් වූ පත් පඳුරු අතර විශාල රුක් හුදෙකලා ව ද ගොමු වශයෙන් ද වැඩී තිබිණ. දොළ පාර වගුරු බිමට වැද ඔබින් වන සමුද්‍රය තෙක් ගමනේදී පත් පඳුරු අතර වංගු ගැසෙමින් ගලා යන අයුරු ඔවුන්ට පෙනුණේ ය. බොහෝ වේලාවක් ඔබ මොබ හැසිරුණ ද වගුරු බිමට පිවිසිය හැකි ස්ථානයක් ඔවුන්ට සොයාගත නොහැකි වී ය.

"වගුරු බිම්වලට බැසීම අනතුරුදායකයි" යි පීටර් දන්වී ය.



Scanned with CamScanner



* බොහෝ පහතින් පියාසර කරන හෙලිකොප්ටරයක හඬ හදිසියේ සවනත වැකෙන විට ඔවුන් මිනිත්තු පහළොවක් පමණ නොනැවතී ගමන් කොට තිබුණේ ය.

"උඩින් වියළි වුණත් යටින් තියෙන්නේ ලිහිල් මඩ තට්ටුවක්. එහෙම තැනක අඩිය තිබ්බොත් ගොඩ එන්ට බැරි විදියට එරෙනවා."

"ඔව්" යි ජැක් එකඟ විය. "එහෙම තැන්වල මිනිස්සු මුළුමනින් ම ගිලෙන බව මම අහලා තියෙනවා. ඒ නිසා මඩට අඩිය තියන්ට එපා."

තවත් මද වේලාවක් තැනි බිමේ හැසිරුණු ඔවුහු හිරු මුදුන් වීමට ආසන්න වත් ම පෙරළා පැමිණ දිවා ආහාරයෙන් ඉක්බිති විවේකී ඉරියව්වෙන් බිම වැතිර ගත්තෝ ය.

සවස තුනට පමණ ඔවුන් යළිත් වරක් කූඩාරමෙන් පිටතට බසින විට සූර්යාගේ සැඩ රැස් මුළුමනින් පහ ව නොතිබිණ. එසේ ද වුව නොනැවතී හමන මන්ද මාරුතය හේතුකොටගෙන ගතට විඩා දැනුණේ නැත. පුළුල් වළා ගැබක් ඔවුන්ගේ හිසට ඉහළින් ක්ෂිතිජය දෙසට වේගයෙන් පාවී ගියේ ය. බොහෝ ඈත වගුරු බිමට ඔබින් වන මහ සයුර සැඩ හිරු රැස් වැද දිළිණ.

"අපි ගුවන් හමුදා කඳවුර පැත්තට යමු." යි පීටර් පෙරමුණ ගත්තේ ය.

එදින සන්ධ්‍යාවෙහි කළ යුතු අන් කිසිත් නොවූයෙන් සෙස්සෝ ද හිස් සලා ඔහු අනුගමනය කරන්නට වූහ. කූඩාරම පිටුපස කඳු බෑවුම නැගගත් ඔවුහු ඉකුත් දිනයෙහි පැමිණි මග ඔස්සේ පෙරළා පියවර මැන්නෝ ය.

"අපි ඊයෙ එද්දි කඳවුර නොදුටු එකයි පුදුමෙ" යි පෙරටුව ගමන් කළ පීටර් කීවේ ය. "මහළු ජෝ කිවූ හැටියට නම් ඒක තියෙන්ට ඕනෑ මේ කිට්ටුවමයි."



Scanned with CamScanner

"ඒක ඇත්ත" යි ජැක් එකඟ විය. "නමුත් ආරක්ෂිත කඳවුරක් නිසා ඒක ඇත්තේ හොඳින් සැඟවුණු තැනක වෙන්ට ඕනැ."

බොහෝ පහතින් පියාසර කරන හෙලිකොප්ටරයක හඬ හදිසියේ සවනත වැකෙන විට ඔවුන් මිනිත්තු පහළොවක් පමණ නොනැවතී ගමන් කොට තිබුණේ ය. හිස් ඔසවා බැලූ ඔවුන්ට වගුරු බිම දෙසින් පැමිණි හෙලිකොප්ටරයක් ගුවනේ වටයක් කැරකී කන්දේ දකුණු පසින් වන සීඝ්‍ර බෑවුම දෙසට සෙමින් පහත් වනු දර්ශනය වී ය. තවත් ස්වල්ප වේලාවකින් ම බෑවුම පත්ලේ රුක් ගොමු අතරින් එය අතුරුදන් වූයේ ය.

"කඳවුර ඇත්තේ ඔතන වෙන්ට ඕනැ" යි පහත බෑවුම පිරික්සමින් බිල් කී ය. "අපට ඊයෙ ඒක නොපෙනීම පුදුමයක් නොවෙයි. මෙතෙන්ට කඳවුරක ලකුණක්වත් පෙනෙන්නේ නැහැ."

"ඔය කඳවුර ළඟට යන්නේ කොහොමද?" යි ඩික් විස්ම වී ය. "මේ බෑවුම බහින්ට ලෙහෙසි නැහැ."

"එතෙන්ට යන්ට වෙනත් මගක් ඇති. අපි තවත් ඉස්සරහට ගිහින් බලමු."

මද දුරක් පෙරට ම ගමන් කළ ඔවුහු උස් බිම ක්‍රමයෙන් බෑවුම් වෙමින් පහතට දිවෙන ස්ථානයකට පැමිණියහ. හෙලිකොප්ටරය අතුරුදන් වූ දකුණු දිශාවට හැරී බෑවුම බැසගත් ළමෝ එහි පත්ලේ සිට විහිදෙන සම බිමකට සම්ප්‍රාප්ත වූවෝ ය. ඉක්බිති කඳවුර පිහිටියේ ය යි අනුමාන කෙරෙන දිශාවට හැරී ඇතින් වන රුක් පන්තියක් දෙසට සම බිම හරහා පා ඔසවන්ට වූහ.

"කඳවුර ඇත්තේ ඔය ගස් පෙළට පිටිපස්සෙන් වෙන්ඳ ඕනෑ" යි ඩික් අනුමාන කළේ ය. "ඒක මෙතනට නොපෙනෙන්නෙ ගස් නිසයි."

"ඔව්. හොඳින් සැඟවුණු තැනක්"

"නමුත් මෙහෙම තැනක ගුවන් කඳවුරක් සඟවලා තියෙන්ට හේතුව නම් මට තවමත් හිතාගන්ට අමාරුයි" යි පීටර් දෙබැම රැළි නැංවී ය. "අපි ළඟට ම ගිහින් බලමු. එතකොට හේතුව තේරුම් ගන්ට පුළුවන් වෙයි.!"

උස් ව වැඩුණු කඳු ගැටයකින් සීමා වූ තැනිතලාවේ අන්තය දෙසට ඔවුහු සෙමින් පා එසවූහ. විනිවිද නොපෙනෙන තරමට ඝන ව කන්ද අබියසින් වැඩුණු රුක් පන්තිය හේතුකොටගෙන කඳු පාමුල ඔවුන්ට නොපෙනිණ. යථෝක්ත කන්දේ මුදුන කුරුළු හොටක් පරිද්දෙන් පුළුල් ව පෙරට නෙරා ඇති බැවි වඩා ආසන්න වත් ම පෙනී ගියේ ය. එසේ ද වුව කඳවුරක් තබා මිනිස් වාසයක සලකුණකුදු එතෙක් දර්ශනය වූයේ නැත.

රුක් පන්තිය හරහා ගමන් කළ ඔවුහු එහි ඇතුළු සීමාවට පිවිස, නැවතී තමන් අබියස පිරික්සූහ. ඔවුන් නතර වූ තැන සිට අක්කර විසි පහක පමණ තැනිතලාවක් කඳු පාමුල තෙක් විහිදෙයි. රුක් පන්තියට පියවර පණහක් පමණ ඇතින් ඇරඹෙන කම්බි වැටකින් යථෝක්ත තැනිතලාව තුන් පැත්තකින් වට වී ඇත. මෙසේ නිර්මාණය වූ කොටුවේ ඈත අන්තයෙහි කඳු පාමුල දෙසින් පහත් වහළයෙන් යුතු ගොඩනැගිලි කිහිපයක් වෙයි. ප්‍රධාන ගොඩනැගිල්ල මෙන් පෙනුණු එකක් කඳු බෑවුමට යාකොට ඉදි වී ඇත. කුරුළු හොටක් බඳු අස්වාභාවික හැඩයකින් පෙරට නෙරා සිටි කඳු මුදුන දැවැන්ත පියස්සක් සෙයින් කඳවුරට ඉහළින්



Scanned with CamScanner

පැතිරෙයි. පියස්සේ සෙවණ ලබමින් රාජකීය ගුවන් හමුදාවේ ලාංඡනය සහිත හෙලිකොප්ටරයක් කඳවුරු භූමිය මධ්‍යයෙහි නතර කොට තිබේ. වැටේ එක් පසෙක ඉදි කළ කඩුල්ලේ පහත දැක්වෙන සංඥා පුවරුව සවි කොට තිබුණේ ය.

| |
|---|
| *අවවාදයයි* |
| *රාජකීය ගුවන් හමුදාවේ කඳවුරකි ඇතුල්වීම තහනම්.* |

"මේක නම් බොහොම අපූරුවට ආරක්ෂා වුණු කඳවුරක්" යි මද වේලාවක් තිහඬ ව කඳවුර පිරික්සූ ජැක් සෙස්සන් දෙස බැලී ය.

"ඔව්. අර ස්වාභාවික කඳු පියස්ස නිසා කඳවුර අහසට පෙනෙන්නේ නැහැ"

"ඒ හැරෙන්ට මේ ගස් සීමාව පහු කරනකම් තැනිතලාවටත් පෙනෙන්නේ නැහැ"

"කොයි තරම් ස්වාභාවික ව ආරක්ෂා වුණත් මුරකාවල් දමන්ට ඔවුන් අමතක කරලා නැහැ. අර බලන්ට".

පීටර් විසින් දක්වන ලද දිසාවට හැරුණු සෙස්සෝ කඳවුර අභ්‍යන්තරයේ වැට අද්දරින් සක්මන් කරන මිනිසකු දුටහ. තුවක්කුවක් උරයෙහි රඳවාගෙන සිටි හෙතෙම ගුවන් හමුදා නිල ඇඳුමෙන්



Scanned with CamScanner

සැරසී සිටියේ ය. රුක් ගොමුවේ සිට තවත් මද වේලාවක් කඳවුර පිරික්සුව ද මුරකරු හැරෙන්නට අන් කිසිවෙක් ඔවුන් විසින් නොදක්නා ලදී.

"මුරකාරයා හැරෙන්ට වෙනත් කෙනෙක් කඳවුරේ නැද්ද?" යි පීටර් විස්මයෙන් නළල රැළි නැංවී ය.

"ආරක්ෂාව ගැන ඒ හැටි ප්‍රශ්නයක් නැති නිසා අනිත් අය අර ගොඩනැගිලි ඇතුළේ ඇති" යි බිල් පිළිතුරු වශයෙන් කී ය.

ඔහු මෙසේ පවසන්නා හා ම කඳු බෑවුමට යා ව ඉදි වූ ගොඩනැගිල්ලේ දොරටුව විවෘත වී මිනිසුන් දෙදෙනෙක් පිටතට බැස යානය දෙසට පැමිණෙන්ට වූවෝ ය. එකෙක් තරබාරු සිරුරින් යුතු මිටි මිනිසෙකි. අනිකා ගුවන් නියමුවකුගේ ඇඳුම් හැඳ සිටි තරමක් උස එකෙකි.

මිනිසුන් දෙදෙනා යානය කරා පැමිණෙන්ට ද ප්‍රථම ගිලන් ඇඳක් ඔසවාගත් තවත් දෙදෙනෙක් පෙර කී ගොඩනැගිල්ලෙන් පිට වූවෝ ය. ඉක්බිති නියමුවාගේ අණින් යහන හෙලිකොප්ටරය තුළට දමූ ඔවුහු පෙරළා ගොස් ගොඩනැගිල්ලට වැදුණාහ. තවත් ස්වල්ප වේලාවකින් තරබාරු මිනිසා හා නියමුවා ද යානයට ඇතුළු වූයෙන් එය අහසට නැගී වගුරු බිම දිශාභිමුඛ ව පියාසර කරන්ට වී ය.

"ලෙඩෙක් රෝහලකට ගෙනියනවා වෙන්ට ඇති" යි ඈත් ව යන යානය දෙස මද වේලාවක් නෙත් යොමා සිටි ඩික් කීවේ ය.

"ඒ ලෙඩෙක් නම් ඔහොම ගරු සරු නැති විධියට හෙලිකොප්ටරය ඇතුළට විසි කරයි ද?" යි බිල් හරස් වී ය.



Scanned with CamScanner

"ලෙඩෙක් ගෙනියන්ට ඕනෑ බොහොම ප්‍රවේශමෙන්"

"අනික, යානය ගියේ වගුරු බිම දිශාවට. ඔය පැත්තෙ කොහෙද රෝහල් තියෙන්නේ? වගුරු බිමත් මහ මුහුදත් විතරයි."

"ඒක ඇත්ත" යි ජැක් එකඟතාවය පළ කළේ ය. "සමහර විට මැරුණු කෙනෙකුගේ මිනිය වගුරු බිමට දමන්ට ගෙනියනවා වෙන්ට පුළුවනි."

"නමුත් මැරුණු නිලධාරියෙකුගේ මිනිය එයාගෙ නෑයන්ට භාර නොදී ඔහොම විසි කරන සිරිතක් තියෙනවාද?" යි පීටර් විචාළේ ය. "මට නම් මේ කඳවුර ගැන ලොකු සැකයක් තියෙනවා."

"කොයිකටත් අපි ළඟට ගිහින් මුරකාරයාට කථා කරමු." යි සැඟ ව සිටි සෙවණැලි අතරින් මිදී වැටෙහි අගුල් දැමූ කඩුල්ල දෙසට පියවර තබමින් බිල් කීවේ ය.

පියවර දහයකට හෝ පහළොවකට වඩා ගමන් කරන්ට ද ප්‍රථම ඔවුහු මුරකරුවා විසින් දර්ශනය කරන ලදහ. මුළින් ම මිනිසාගේ මුහුණේ පහළ වූයේ දැඩි විස්මයකි. තැති ගත්තාක් මෙන් මොහොතක් නතර ව සිටි හෙතෙම වේගයෙන් කඩුල්ල දෙසට පැමිණෙමින්,

"මොනවද ඕනෑ?" යි රළු හඬින් ප්‍රශ්න කළේ ය.. මේක ගුවන් හමුදා කඳවුරක් වග පෙනෙන්නේ නැද්ද?"

"අපට කඳවුර බලන්ට පුළුවන් ද?" යි පෙරමුණ ගනිමින් ජැක් පෙරළා විචාළේ ය. "අපේ ගුවන් කඳවුරක් මෙතන තියෙන බව දැකලා අපි පුදුම වුණා."



Scanned with CamScanner

"මොනවට පුදුම වෙන්ට ද?" යි මිනිසා කෝප වූ හඬින් කෑගෑවේ ය. "මේක රාජකීය ගුවන් හමුදාවේ කඳවුරක්. ඉදි කරලා තියෙන්නේ රටේ ආරක්ෂාවට. අනික, පිටස්තරයන්ට මෙහාට ඇතුළු වීම තහනම්. ඒ නිසා දැන් ම ම මෙතනින් පිට වෙනවා. ආයෙත් මේ පැත්ත පළාතට එන්ට එපා. ආවොත් වෙඩි තියනවා."

අනපේක්ෂිත මේ තර්ජනයෙන් බියට පත් සිව් මිතුරෝ වහ වහා රුක් සීමාව තුළට පසු බැස්සාහ.

"පුදුම මිනිසෙක්" යි යළි රුක් ගොමුවට වැදුණු ඉක්බිති ජැක් කෝපයෙන් ගුගුළේ ය. "එයා තර්ජනය කළේ හරියට අපි ලොකු හොරකමකට ආවා වගෙයි."

"ඔව්." යි පීටර් හිස සැලී ය. "මේ කඳවුරේ රහසිගත යමක් තියෙනවා ය කියන සැකය ඒකෙන් තවත් තහවුරු වෙනවා"

"ඒ රහස දැනගන්ට නම් කඳවුරට ඇතුලු වෙලා ම බලන්ට ඕනෑ" යි බිල් කථාවට එක් විය. "නමුත් මුරකාරයා ඉන්නකම් ඒක කරන්ට බැහැ"

"කළුවර වැටුණට පස්සේ ඇවිත් බලමු." යි ඩික් යෝජනා කළේ ය. "එතකොට අපට යමක් දැනගන්ට ලැබෙයි."

අන්ධකාරය එළඹි ඉක්බිති යළි ගුවන් කඳවුරට පැමිණීමට අදිටන් කළ සිව් මිතුරෝ ස්වකීය කුඩාරම බලා පෙරළා ගමනාරම්භ කළෝ ය.

* * * *

'අපි ගුවන් කඳවුරට ගියේ ලොකු වටයකින් ය කියල

සැකයක් මට ඇති වුණා" යි කූඩාරම අබියස හිඳ සිටි බිල් මැතිත් වැඩුණු තරමක් උස් වූ කඳු ගැටයක් දෙස නෙත් හෙළුවේ ය. "ඔය කඳවුර තියෙන්නේ මේ කඳු ගැටයේ අනික් පැත්තේ වෙන්ට බැරිද?"

"බිල්ගේ සැකය හරි" යි තම සගයා විසින් දක්වන ලද කඳු ගැටය දෙස සුපරීක්ෂාකාරී බැල්මක් හෙලමින් ජැක් එකඟ වී ය. "කුරුළු හොටක් වගේ මුදුනක් තියෙන කන්ද මේක තමා."

"එහෙම නම් අපට කන්දේ මේ පැත්තෙන් නැගලා කඳවුරට බහින්ට පුළුවනි." යි පීටර් කීවේ ය. "කන්දේ එහා පැත්තෙ බෑවුම වැටකින් රැකවල් කරලා නැහැ. තිබුණේ කුඩා ගොඩනැගිලි කීපයක් විතරයි".

'නමුත් කියන තරම් ලේසියෙන් ඒක කරන්ට බැහැ" යි ඩික් විරුද්ධ වී ය. "පෙනෙන්නේ නැද්ද? කන්දේ මේ පැත්ත ඉහළට යනකම් කළු ගල් බැම්මක් වගෙයි. පය ගහලා නගින්ට පුළුවන් තැනක් ඇත්තේ ම නැහැ. කිසි සතුරෙකුට මේක නගින්ට බැරි වග දන්නා නිසයි ඔවුන් මේ පැත්ත රැකවල් නොකළේ."

"කෝකටත් ගිහින් බලමු"

යථොක්ත කඳු ගැටය දෙසට ගමන් කළ ඔවුන්ට පාමුල සිට ඉහළට අඛණ්ඩ ව විහිදෙන සීඝ්‍ර බෑවුම් සහිත ගිරි කඳුරකින් එය යුක්ත වන බැව් පෙනී ගියේ ය. මිනිසකුට තබා සතකුට හෝ පා තබා නැගගත හැකි එක ද ස්ථානයක් ගසෙන් හා පසෙන් තොර එහි නොමැති බැව් නොබෝ වේලාවකින් ම අවබෝධ කොටගත් ඔවුහු අධෛර්යයට පත් සිතින් පෙරළා කූඩාරම කරා පැමිණියහ.

රාත්‍රියෙහි ගුවන් කඳවුර පිරික්සීමට කතිකා කොටගෙන



Scanned with CamScanner

තිබුණ ද සියල්ලන් ම අධික විඩාවෙන් පෙළුණු හෙයින් එකී කර්තව්‍යය පසු  දිනයට කල් දමූ සිව් මිතුරෝ රාත්‍රී ආහාරය අනුභව කොට ඇඳිරි වැටී නොබෝ වේලාවකින් ම නින්දට වන්නෝ ය.



Scanned with CamScanner

# 3

පසු දින සන්ධ්‍යාවෙහි සිව් මිතුරන් ගුවන් කඳවුර අබියස රුක් ගොමුව කරා පැමිණෙන විට රාත්‍රිය එළඹ තිබුණේ නැත. ඔවුන්ට අවශ්‍ය වූයේ කඳවුරේ ස්වාභාවයත් එහි හට ගැනෙන සියල්ලත් ඈතක සිට තව දුරටත් නිරීක්ෂණය කිරීමට ය.

මුරභටයා සුපුරුදු පරිදි තුවක්කුව ද රැගෙන කම්බි වැට අද්දරින් සක්මන් කරමින් සිටියේ ය. දෙපා එකිනෙකට සිර වන සේ කෙටි ඇඳුමක් හැඳ සිටි මිනිසුන් දෙදෙනකු කඳු පාමුල ආසන්නයේ පිහිටි එක් ගොඩනැගිල්ලකින් පිට වී තවෙකකට ඇතුළු වනු පෙනිණ. කඳවුරු භූමියට ඉහළින් පියඹා පැමිණි කුරුළු රැනක් රාත්‍රී විවේකය අපේක්ෂාවෙන් ළමුන් සැඟ ව සිටි රුක් ගොමුවේ තුරු වදුළු අතරට වැදුණේ ය. ඒ හැරුණු විට කඳවුරේ ශාන්ත නිහඬ බව බිඳින අන් කිසිවක් බොහෝ වේලාවක් ගත වන තෙක් නොදක්නා ලදී.

"ආ! මට කියන්ට අමතක වුණා." යි සන ව වැඩුණු ගස් අතරින් කඳවුර පිරික්සමින් සිටි ජැක් හදිසියේ හැරී සෙස්සන් ඇමතී

ය. "අර පොළොව යට ශබ්දය ඊයෙ රෑත් ඇහුණා."

"මටත් ඇහුණා" යි බිල් එකහතාවය පළ කළේ ය. "නමුත් මහන්සි නිසා ඒ ගැන වැඩි දුර හිතුවේ නැහැ."

"ඔය ශබ්දය මොකක් වෙන්ට පුළුවන්ද? " යි ඩික් විස්ම වී ය. "රෑට ඇහෙන දවල්ට නැහෙන පුදුමාකාර ශබ්දයක්. පොළොව යට කැළඹීමක් නම් දවල්ට නැසෙන්නේ ඇයි?"

"හිතාගන්ට අමාරු ඒක ම තමා... සමහර විට...."

"ඒයි අර බලන්ට අහස දිහා" යි ජැක් කිසිවක් පැවසීමට සැරසෙත් ම පීටර් ඔහු නිහඬ කළේ ය.

තම සගයා විසින් දක්වන ලද දිශාවට නෙත් හෙලන සෙස්සෝ ඈත අහසේ බොහෝ ඉහළින් කුඩා කළු පැහැති ලපයක් යන්තමින් දර්ශනය කළහ. ඒ හෙලිකොප්ටරයක් බවත් ගුවන් කඳවුර දෙසට සෙමින් පහත් වන බවත් තවත් නොබෝ වේලාවකින් ම ඔවුන්ට පෙනිණ. ඊට මිනිත්තු දහයකට පමණ පසු යානය කඳවුර මධ්‍යයෙහි නතර කරන ලදින් පෙර දිනයෙහි ඔවුන් විසින් දක්නා ලද තරබාරු මිනිසාත් ගුවන් නියමුවාත් ඉන් පිටතට බැස්සාහ. අනතුරු ව කඳවුර භූමියේ සක්මන් කරමින් සිටි මුරකරුවා විසින් යානයේ පසුපස දොරටුවක් විවෘත කරනුත් දෑත් පසුපසට තබා එක්කොට ගැට ගසන ලද මිනිසුන් දෙදෙනකු ඉන් පිටවනුත් ළමෝ විස්මයෙන් පුළුල් වූ නෙතින් යුතු ව බලා සිටියෝ ය. තවත් මොහොතකින් මුරකරුවා හැරෙන්නට සෙස්සෝ කඳු බෑවුමට යා ව ඉදි කරන ලද ගොඩනැගිල්ල තුළට වැදී නොපෙනී ගියහ.

"මේ වෙන්නේ මොකක්ද?" යි මිනිසුන් අතුරුදන් වූ පසු

පිටර් දෙබෑම නෑංවී ය. 'අත් ගැට ගහලා තිබුණු හැටියට නම් හිරකාරයන් දෙන්නෙක් වගෙයි."

"සමහර විට මේක යුද්ධ හිරකාරයන් රඳවන රහසිගත කඳවුරක් වෙන්ට පුළුවන්" යි ඩික් අනුමාන කළේ ය.

"යුද්ධ හිරකාරයන් ඉන්ට යුද්ධයක් තියෙන්ට එපායැ" යි ජැක් අනිකාගේ නිගමනය බැහැර කළේ ය. "අනික, හිරකාරයන් නම් ඔවුන්ගේ අත් ගැට ගසන්නේ නැහැ; මාංචු දමනවා. ඒ නිසා මේ නිත්‍යානුකූල හිරකාරයන් වෙන්ට බැහැ."

"එහෙනම්?"

"ඒක දැනගන්ට නම් කඳවුරට ඇතුල් වෙන්ට ඕනැ. කරුවල වැටෙන කම් ටිකක් ඉවසමු."

ඈත කඳු පෙළ අතරින් සූර්‍ය්‍යා බැස යන්නට ආසන්න වත් ම බටහිර ආකාශය මද රත් පැහැයටත් ඉක්බිති ලේ පැහැයටත් හැරුණේ ය. කඳවුරු භූමියට පිටතින් හුදෙකලා ව වැඩුණු ගස්වල සෙවණැලි ක්‍රමයෙන් දීර්ඝ වී ය. අවට පරිසරය වටා මද අන්ධකාරයක් පැතිරුණේ ය. රුක් ගොමුව ඇතුළත අඳුර ඊට ද දැඩි විය. මැතින් වන කඳු ගැටය හුදු ඡායා මාත්‍රයක් පමණක් වන තරමට නොපැහැදිලි වූයේ ය.

"අන්න මුරකාරයා යන්ට හැරුණා" යි ඩික් පහත් හඬින් මිමිණී ය. "රට කඳවුර මුර කරන්නේ නැති හැඩයි".

ඔහු විසින් පවසන ලද්දේ සැබෑවකි. මන්ද යත් එතෙක් කම්බි වැට අද්දරින් සක්මනෙහි යෙදුණු මිනිසා තුවක්කුව ද

ඔසවාගෙන යන්නට හැරුණු හෙයිනි. එහෙත් මිනිසා එක එල්ලේ ම කඳවුර තුළ ඉදි වුණු ගොඩනැගිලි දෙසට ගමන් නොකළේ ය. ප්‍රථමයෙන් කම්බි වැටේ වම් පාර්ශවය ආසන්නයේ සිට වූ උස් කණුවක් කරා ගිය හෙතෙම එහි සවි කළ ලීවරයක් බඳු කිසිවක් පහතට ඇද්දේ ය. ඉක්බිති අන්ධකාරයේ ගිලෙමින් පැවති ගොඩනැගිලි දෙසට අතුරුදන් වී ය.

"ඒ මොකක්ද?" යි මිනිසාගේ ඉරියව් මැනවින් පිරික්සමින් සිටි පීටර් විචාළේ ය.

"හිතාගන්ට බැහැ" යි කුඩා විදුලි පන්දමක ආලෝකයෙන් අත් ඔරලෝසුව පිරික්සමින් ජැක් පිළිතුරු දිනි. "දැන් වෙලාව හතයි. තව පැය එක හමාරක් විතර මෙතන ම ඉඳලා ඊට පස්සෙ කඳවුරට ඇතුළු වෙන්ට ක්‍රමයක් තියෙනවාද කියලා හොයල බලමු"

අන්ධකාරය තව තවත් දැඩි විය. අබියසින් පිහිටි කම්බි වැට හා ඇතුළත ගොඩනැගිලි මුළුමනින් පාහේ නොපෙනී ගියේ ය. මඳ වශයෙන් නිල් පැහැ වූ ආකාශය පශ්චාත්භාග කොට කඳු ගැටයේ වක ගැසුණු මුදුන පමණක් ඡායාවක් පරිද්දෙන් යන්තමින් දර්ශනය වී ය. එකිනෙකාගේ ඡායාව මිස හැඩ රුව නොපෙනෙන තරමේ කැබලි කැපිය හැකි ඝන අන්ධකාරයක් ළමුන් වටා පැතිරුණේ ය. අහසේ බොහෝ ඉහළින් මතු වූ අර්ධ චන්ද්‍රයා උණුසුමින් තොර මළානික ආලෝකයක් විහිදුවමින් අඳුර පළවා හැරීමේ නිරර්ථක ප්‍රයත්නයක යෙදිණි. සඳුගේ තනිය මකාළන්නට මෙන් තන් තන්හි දිලෙන්නට වූ කුඩා තරු කැට කිහිපයක් නොබෝ වේලාවකින් ම අඳුරු වළා ගැබක් යට සැඟ ව ගියේ ය. ළමුන් රැඳී සිටි රුක් ගොමුවේ තැනකින් බස්සකුගේ ගැඹුරු හඬ විටින් විට ශ්‍රවණය වී ය. වවුළන් කිහිප දෙනෙකුගේ පොරකෑමක් හේතුවෙන් මැතින් වූ ගසක අතු වේගයෙන් සැළුණේ ය. සිසිලසෙන් පිරි රාත්‍රී

මන්ද මාරුතය "සර සර" හඬින් අතු සොළවමින් හැමී ය. සිවලුන්ගේ කෑගෑම බොහෝ ඈත තැනිතලාව දෙසින් ශ්‍රවණය වී ය.

පරිසරයේ ගුප්ත අඳුරු බව ළමුන්ගේ සිතට මහත් පීඩාවක් ගෙන දුන් අතර නිහඬ ව නොසෙල්වී මෙසේ සිටීම ඔවුන්ට දැඩි වධයක් වූයේ ය. ගත වී ඇත්තේ පැයක පමණ කෙටි කාලයක් නමුදු පුරා රැයක් එහි ගත කළාක් මෙන් ඔවුන්ට දැනුණේ ය.

"වෙලාව අට හමාරයි" යි විටින් විට අත් ඔර්ලෝසුව පිරික්සීමෙහි යෙදුණු ජැක් පහත් හඬින් දැන් වී ය."දැන් කම්බි වැට ළඟට ගිහින් ඇතුළට පනින්ට ක්‍රමයක් තියෙනවද බලමු."

"ෂ්! යි රුක් ගොමුවෙන් පිටතට බසින්නට සැරසුණු සෙස්සන් හදිසියේ වළකමින් පීටර් අනතුරු හැඟවී ය.

රුක් ගොමුව තුළ ඇවිදින කිසිවකුගේ පා ගැටීමෙන් වියළි පත් පහත් හඬින් තැලෙනු ඇසුණේ ය. හද ගැසෙන හඬ පිටතට ඇසෙන තරම් භීතියක් ළමුන් තුළ අවදි විය. ඔවුහු එකිනෙකාගේ දැත් වැරයේ වැළඳ ගත්හ. තවත් මොහොතකින් අඳුරු ගුලියක් රුක් ගොමුව තුළින් මතු වී කඳවුරේ කම්බි වැට දිශාවට ඇදෙනු පෙනුණේ ය. ඒ කුඩා බැටළුවකු බැව් අවබෝධ වූ පසු ළමුන් තුළ හටගෙන තිබුණු භීතිය ක්ෂණයකින් පහ වූයෙන් දහඩියෙන් තෙත් වූ දැත් ඔවුහු ඇඳුමෙහි පිස දමා ගත්හ.

මේ අතර ක්‍රමයෙන් වැටට ආසන්න වූ බැටළුවා එය ඉව කරන්නට මෙන් මදකට නතර විය. ඉක්බිති යළිත් වරක් ඊට සමීප වූයේ ය. ඒ හා ම ඔසවා විසි කරන ලද්දාක් ළූ හදිසියේ පසු පසට විසි විය. දෙපයින් නැගී පලා යන්නට ළූ කිහිප වරක් නිෂ්ඵල ප්‍රයත්නයක යෙදුණේ ය. අනතුරු ව බිම වැටී මුළුමනින්

නිසල වී ය.

"බැටළුවාට මොකක් වුණාද?" යි ඩික් විස්මිත රාවයක් නැංවී ය.

"හිතාගන්ට බැරිද?" යි සුදුමැලි වූ මුහුණේ මතු වූ දහඩිය බිඳු කිහිපයක් කමිස අතින් පිස දමමින් ජැක් වෙව්ළුම් හඬින් පිළිතුරු දුන්නේ ය. "කම්බියට විදුලිය කවලා. බැටළුවා විසි වුණේ විදුලි සැර වැදුණු නිසයි."

"වෙන්ට බැහැ" යි පීටර් හරස් වී ය. "මුරකාරයා කම්බි වැට අල්ලනවා මම කීප සැරයක් දැක්කා."

"ඒ හවස. නමුත් මිනිහා යන්ට කලින් වැටට විදුලිය කවන ස්විචය ක්‍රියාත්මක කළා. අතන කණුවේ ලීවරයක් පහතට ඇද්දේ ඒකටයි."

මේ බිහිසුණු හෙළිදරව්වත් සමඟ ම තමන්ගේ මුහුණේ රුධිරය සිඳී යන්නාක් මෙන් ළමුන්ට දැනුණේ ය. අනපේක්ෂිත ව හෝ බැටළුවාගේ පැමිණීම නිසා නොවන්නට තමන්ට අත් විඳින්නට සිදු වන භයානක ඉරණම ඔවුන් භීතියෙන් මුසපත් කළේ ය. යම් හෙයකින් කම්බි වැට යත්තමින් හෝ ස්පර්ශ කළේ නම් විදුලි සැර වැදී සියල්ලන් ක්ෂණයකින් මිය යන්නට බොහෝ කොට ඉඩ තිබිණ.

"අපි ගැළවුණේ හාස්කමකින් වගෙයි" යි ඔවුන් අතර පැවති තැතිගත් කෙටි නිහැඬියාව පීටර් වෙව්ළුම් හඬින් බින්දේ ය.

"ඔව්. බැටළුවා නාවා නම් අපි හැමෝ ම මෙලහකටත් මැරිලා" යි ඩික් පහත් හඬින් එකඟ වී ය.



Scanned with CamScanner

"මහ භයානක මිනිස්සු වගයක්" යි බියපත් ව සිටිය ද කෝපය මිශ්‍රිත ස්වරයෙන් බිල් ගුගුළේ ය.

"රැට කඳවුර මුර නොකරන්නේ ඊට වැඩි ආරක්ෂාවක් විදුලි වැටෙන් ඔවුන්ට ලැබෙන නිසයි."

ඔවුන් අතර යළිත් වරක් හටගත් මඳ නිහැඬියාව පීටර් විසින් අන්තයේදී බිඳින ලදී.

"දැන් අපි මොකක්ද කරන්නේ?" යි ඔහු විචාළේ ය. "කඳවුර ඇතුළට තබා වැට කිට්ටුවටවත් අපට යන්ට බැහැ".

'ඔව්. කඳවුරට ඇතුල් වන අදහස දැනට අත් අරින්ට අපට සිද්ධ වෙනවා. අපි ආපහු ගිහින් වෙනත් ක්‍රමයක් ගැන හිතන්ට ඕනෑ."

තවත් කළ යුතු කිසිත් එහි නොවූයෙන් ස්වකීය කූඩාරමට පෙරළා පැමිණෙන අටියෙන් ඔවුහු වන ලැහැබ හරහා ගමන් කරන්ට වූවෝ ය. එහෙත් මේ මොහොතේ සිදු වූයේ කිසි සෙයිනුත් අපේක්ෂා නොකළකි.

අකුණු පිපිරෙන හඬ බොහෝ ඈතින් හදිසියේ ඇසෙන්නට වූ අතර රිදී සර්පයන් රාශියක් පරිද්දෙන් අහසේ විහිදුණු විදුලි සැරයෙන් වන ලැහැබ ආලෝකමත් වී ය. වේගවත් මාරුතයක් රුක් මුදුන් අඹරවමින් හමා ගියේ ය. අතු එකිනෙක ගැටීමෙන් දෙසවන් බිහිරි කරවන "කිරි කිරි" නාදයක් ශ්‍රවණය විය. නොනැවතී එක පිට පුපුරා යන හෙණ පහරින් සමස්ථ පරිසරය ගිගුම් දුන්නේ ය. අනතුරු ව ධාරානිපාත වර්ෂාවක් ඇද හැලෙන්නට වී ය.

හෙණ හඬ ඇතින් නැගෙන්නට වූ කෙණෙහි සිව් මිතුරන් වන ලැහැබ හරහා තැනිතලාව දෙසට දිවෙන්නට පටන්ගෙන තිබිණ. එතෙකුදු වුව ඝන අන්ධකාරය හේතුකොටගෙන සන්ධ්‍යාවෙහි පැමිණි මග ඔවුන්ට සොයාගත නොහැකි විය. ඝන ව වැඩුණු රුක් කඳන් මත ගැටීමත් විටින් විට පය පැකිළී ඇද වැටීමත් වැළකිය නොහැකි වූයේ ය. රුක් මුදුන් ඉහළින් ඇදී යන විදුලි සැරයෙන් මග විටින් විට ආලෝකමත් වූ නමුදු ඒ කෙටි ක්ෂණයකට පමණකි. වර්ෂාවේ තෙමෙමින් ද ඇද වැටෙමින් ද දිව යන ඔවුන්ට එකිනෙකා නොපෙනිණ. දිවෙන දිශාව පිළිබඳ සියළු අවබෝධය ද මුළුමනින් බැහැර වූයෙන් ඔවුහු හිස් හැරුණු අත දුවන්නට වූවෝ ය.

ස්වල්ප වේලාවක් නොනැවතී පෙරට ම ඇදුණු ඩික් හදිසියේ නතර ව සෙස්සන්ගේ හඬ ඇසේ ද යි මදක් සවන් යොමුවේ ය. එහෙත් සුළඟේ ඝෝෂාවත් තුරු හිස් මතට වර්ෂාව ඇද හැලෙන හඬත් ගස් කොළන් සැලෙන ශබ්දයත් හැරෙන්නට අන් කිසිත් නැසිණ. තමා සෙස්සන්ගෙන් වෙන් වී ඇති බැව් අවබෝධ වීමෙන් ඔහු තුළ මද තැති ගැන්මක් හටගති. ඔහු කිහිප වරක් ඔවුන්ගේ නම් එකිනෙක උස් හඬින් කෑගැව ද වේගයෙන් හමන මාරුතයේ ඝෝෂාව අභිභවන්නට ඔහුගේ හට හඬ සමත් වූයේ නැත. කවර දිශාවකට හැරිය යුතු ද යි මදක් සිත් යොමු කළ මුත් ඝන අන්ධකාරයෙන් වැසුණු වනාන්තරය ඒ පිළිබඳ සුදුසු ඉඟියක් නොසැපයී ය. "මම අතරමං වුණා " යි ඔහු තමාට ම මුමුණා ගත්තේ ය. "කිසි ම ආරක්ෂාවක් නැති ව මට එළිවෙනකම් වැස්සේ තෙමෙන්ට වෙයි. " හදිසියේ ම එක පිට පුපුරා ගිය හෙණ පහර කිහිපයක් හේතුකොටගෙන වනාන්තරය ඒකාලෝක වීමෙන් තමා අබියසින් ඝන ව වැඩුණු මහ පඳුරක් ඔහු දිටී ය. වර්ෂාවෙන් ගැළවීම මේ වන විට ඔහුගේ සිත අධිපති කොටගත් එක ම සිතිවිල්ල වූ හෙයින් සර්පයන්ගෙන් ඇති විය හැකි අන්තරාය ද නොසලකා ඔහු පඳුර තුළට වැදිණ. කටු සහිත අත්තක් ඔහුගේ

මුහුණේ වැදී ලිස්සා ගියේ ය. දෙවැන්නකින් ඔහුගේ කමිසය යන්තමින් ඉරිණ. එහෙත් පදුරු ගොමුවේ අභ්‍යන්තරය වියළි ව තිබීම ඔහුට මහත් සතුටක් වී ය. වියනක් සෙයින් හිසට ඉහළින් ඝන ව පැතිරුණු පදුරු මුදුන කරණකොටගෙන වර්ෂාව එතුළින් ඇද හැළුණේ නැත. ඔහු ප්‍රවේශමින් අත පත ගා අඳුරේ ම බිම හිඳ ගත්තේ ය. අත පය දිග හැර ගත නොහැකි වුව ද තමා වර්ෂාවෙන් ගැළ වී ය යි ඔහු තුළ ප්‍රීතියක් පහළ විය. දෙදණ මත හිස රඳවාගෙන ඒකාකාරී ව ඇද හැලෙන වර්ෂාවේ හඬට සවන් යොමමින් ම හෙතෙම සෙස්සන්ට කවරක් වී ද යි සිතන්නට නැත් කළේ ය. එහෙත් එකී සිතිවිල්ලේ අඩක් හෝ තියැළෙන්නට මත්තෙන් ඔහු සුවයෙන් තොර වුව ද ගැඹුරු නින්දකට වැටුණේ ය.

# 4

ඩික් තමන් කෙරෙන් වෙන් වී ඇති බැව් අවබෝධ වන විට ජැක් ඇතුළු සෙස්සන් වනාන්තරයේ පිටත සීමාවට ආසන්න ව සිටියහ. ඝන අන්ධකාරයෙහි එක එල්ලේ පෙරට දිව ගිය ඔවුන් තිදෙනා එකිනෙකාගෙන් වෙන් නොවූයේ හාස්කමකින් මෙනි.

"ඩික් කොහේ ද?" යි රුක් ගොමුවේ සීමාවට පැමිණි ජැක් හති ළමින් නතර විය.

"දැක්කේ නැහැ" යි ඔහු පිටුපසින් පැමිණි බිල් තම සගයා හා එක් විය. "අපි පිටිපස්සෙන් එයා දුවන සද්දෙ ඇහුණා විතරයි."

"ඒ ආවෙ මම" යි පීටර් ඔවුන් අසලට පැමිණියේ ය. "මම හිතුවෙ මා ඉදිරියෙන් දුවන්නේ ඩික් ය කියලයි."

"එහෙනම් ඩික් අන්ධකාරෙ වෙනත් පැත්තකට දුවන්ට ඇති" යි ජැක් කලබල වී ය.



Scanned with CamScanner

"දැන් මොකක් ද කරන්නේ? වැස්ස දැන් ම ම නතර වන බවක් පෙනෙන්නේ නැහැ."

ඔවුන් අබියස තැනිතලාවට ඉහළ ආකාශය මුළුමනින් කළු පැහැ වී තිබුණේ ය. සඳක හෝ තාරකාවක සේයාවකුදු නොපෙනිණ. අඳුරු ආකාශය පශ්චාද්භාග කොට රිදී පැහැති සර්පයන් පරිද්දෙන් දඟර ගැසෙමින් පුපුරා යන විදුලි සැරයෙන් ආලෝකමත් වූ තැනිතලාවේ තන් තන්හි හුදෙකලා ව වැඩුණු දැවැන්ත රුක් කළු පැහැති රකුසන් සෙයින් දිස් විය. චණ්ඩ මාරුතය හෝ වර්ෂාව යන්තමින් හෝ හීන ව නොතිබුණේ ය.

"ඩික් හොයන්ට අපි ආපසු යන්ට ඕනෑ" යි දෑස් වසා වැගිරෙන වැසි දිය දෑතින් ඉවත් කරන්නට තැත් කරමින් ජැක් පැවසී ය." ගහක හැපිල වැටිලා සිහි නැති වුණාවත් ද දන්නේ නැහැ".

සෙස්සන් ද වැසි දියෙන් තෙමුණු හිස් සලා එකඟතාවය පළ කළෙන් ඔවුහු යළිත් වරක් හැරී ඩික්ගේ නම විටින් විට හඬ ගාමින් වනය තුළින් පෙරළා ගමන් කරන්ට වූවෝ ය. ඔවුන් පැයක් පමණ මෙසේ වනය තුළ හැසිරුණ මුත් ඩික්ගේ සේයාවකුදු දැකගත නොහැකි වී ය. ඔවුන්ගේ කෑගැමට පිළිතුරු ද නොලැබිණ.

"මේක තේරුමක් නැති සෙවීමක්" යි දෙපයින් නැගෙන වේදනාවෙන් මැඩී සිටි පීටර් කී ය. ගල් මුල්වල හැපී ඇද වැටීමෙන්, හට ගත් සීරීමෙන් සියල්ලන්ගේ සිරුරු එක ලෙස වධ දුන්නේ ය.

"ඔව්" යි අධෛර්යයට පත් සිතින් ජැක් එකඟ විය. "හෙට එළිය වැටුණට පස්සෙ හොයන්ට බලමු. එතකම් කොහාට හරි වෙලා වැස්සෙන් බේරෙන්ට බලන්ට ඕනෑ."



Scanned with CamScanner

''නමුත් යන්නේ කොහාට ද? කොහෙත් එක විධියට ම තෙමෙනවා.''

''අපි හවස තැනිතලාවෙ ඉඳලා රුක් ගොමුව හරහා කඳවුර දිහාට එද්දී විශාල ගල් කුළක් දුටුවා මතකද? ගලේ එක පැත්තක් බිම ඉඳලා අඩි පහක් විතර ඉහළින් වහළක් වගේ පිටතට නෙරලා තිබුණා. ඔය ගල හොයාගන්ට ලැබුණොත් වැස්සෙන් ගැළවෙන්ට පුළුවනි.

''හරි. මට මතකයි ඒක තියෙන තැන'' යි බිල් පෙරමුණ ගත්තේ ය. ''යමු''.

බිල්ගේ මග පෙන්වීම යටතේ යළිත් වරක් ගමනාරම්භ කළ ඔවුහු නොබෝ වේලාවකින් ම ජැක් විසින් සඳහන් කරන ලද පර්වතය අසලට පැමිණියහ. ඔහු පැවසූ පරිදි ම එහි එක් පාර්ශවයක් පියස්සක් පරිද්දෙන් පුළුල් ව පෙරට නෙරා තිබුණෙන් වර්ෂාවෙන් හා සුළඟින් ගැළවීමට ඒ කදිම ස්ථානයක් මෙන් පෙනිණ. එසේ ද වුව කිසි සෙයින්නුත් අපේක්ෂා නොකරන ලද පරිදි ඔවුන් පැමිණෙන්ට ද ප්‍රථම වෙනත් ආගන්තුකයන් පිරිසක් එකී ක්ෂේම භූමිය ආක්‍රමණය කොට අත්පත් කොටගෙන තිබුණේ ය. ඒ බැටළු රැළකි. තමන්ගේ සම්ප්‍රාප්තියෙන් බැටළුවන් කලබල වේ දැ යි සැකයක් ඔවුන් තුළ පැවති මුත් තමන් මෙන් ම සීතලෙන් මැඩී ආරක්ෂාව සොයා පැමිණි මේ නවක ආගන්තුකයන්ට ද බැටළුවෝ නිහඬ ව තමන් අතර ඉඩකඩ සලසා දුන්හ. බැටළුවන්ගේ ලොමින් පිරි සිරුරු අතර සුව පහසුව හිඳ ගත් මිතුරෝ එළි වන තෙක් එහි රැඳීමේ අභිලාශයෙන් කඩින් කඩ නින්දට වන්නෝ ය.



Scanned with CamScanner

# 5

ගැඹුරු නින්දක ගැලී හුන් ඩික් හදිසියේ අවදි විය. රාත්‍රිය මුළුල්ලේ ඇද වැටුණු වර්ෂාව ද හැමූ සුළඟ ද නතර වී තිබුණේ ය. එහෙත් තමා අවට ඝන අන්ධකාරයක් රජයන බැව් ඔහුට පෙනිණ. "අද එළිවෙන්නේ නැද්ද?" යි තමාට ම මුමුණාගත් හෙතෙම අත් ඔරලෝසුව පිරික්සන අරමුණින් සාක්කුවක බහාළු කුඩා විදුලි පන්දම පිටතට ගත්තේ ය. ඇඳුම් තෙත් වී තිබුණ ද දිය නොරඳන වැස්මකින් පන්දම ආවරණය වී තිබීම ඔහුට මහත් සහනයක් විය. ඔහු පන්දම දල්වා ඔරලෝසුව පිරික්සී ය. වේලාව හය පසු වී විනාඩි විස්සක් බැව් එහි සටහන් ව තිබිණ. ඔරලෝසුව නතර වී ඇතැ යි සැක සිතුණු බැවින් ඔහු යළිත් වරක් එය පරීක්ෂා කළේ ය. නැත. එය මැනවින් ක්‍රියා කරයි. එසේ නම් අන්ධකාරය පහ වී නැත්තේ මක් නිසා ද? සූර්යාලෝකය පැතිරිය යුත්තේ මීට බොහෝ වේලාවකට මත්තෙනි. එක් ඉරියව්වක ම හිඳීමෙන් ඔහුගේ අත් පා රිදුම් දිණි. ඔහු සෙමින් නැගිට පඳුරෙන් පිටතට බැස්සේ ය. අතු මත රැඳුණු දිය බිඳු කිහිපයක් ඇද වැටුණු මුත් වර්ෂාව මුළුමනින් පහ ව තිබිණ. එහෙත් වේලාව හය පසු වීත් සූර්‍යයා නොනැගීම ඔහුට වටහාගත නොහැකි ගැටළුවක් වී ය. යළිත් වරක් තමා අවට

පිරික්සන ඔහුට අන්ධකාරයට හේතු වූ කාරණා ක්‍රමයෙන් අවබෝධ විය. අවටින් පැතිරී ඇත්තේ රාත්‍රී අන්ධකාරය නොව විනිවිද නොපෙනෙන ඝන මීදුමකි. සූර්‍යා නැගීමත් සමඟ ම මීදුමේ කළු පැහැය මැකී ගොස් සුදු පැහැයට හැරුණු මුත් පියවර කිහිපයකට වැඩි දුරක් නොපෙනෙන තරමට එය ඝන වූයේ ය.

"එක කරදරේකින් තවත් කරදරේක වැටුණා" යි ඔහු තමාට ම කියා ගත්තේ ය. "මම දන් අතික් අය හොයන්නේ කොහොමද? අනිත් අතට මෙතෙන්ට වෙලා බලා ඉන්ටත් බැහැ."

වනයේ ඇතුළු හෝ පිටත සීමාව ඇති දිශාව ඔහුට යන්තම්න් හෝ සිතාගත නොහැක. එතෙකුදු වුව නිකරුණේ තව දුරටත් පඳුර අසල රැඳීමෙන් යහපතක් අත් නොවන බැව් අවබෝධ කළ හෙතෙම අන්ධයකු පරිද්දෙන් ඉදිරියට පා ඔසවන්ට වූයේ ය. ඝන මීදුමක් තුළින් මෙසේ ගමන් කිරීම නවක අත්දැකීමක් වූයෙන් මද වේලාවක් ගත වන තෙක් එය ඔහුට මහත් ප්‍රීතියක් විය. එහෙත් ක්‍රමයෙන් එය ඒකාකාරී වත් ම ප්‍රීතිය පහ ව ගොස් මීදුම මැකේ නම් යෙහෙකැ යි ඔහුට සිතුණේ ය.

තමා වනයෙන් පිට වී ඇති බැව් හදිසියේ ඔහුට දැනිණ. ඔහු දෑත දෙපසට විහිදුවමින් අවට පිරික්සී ය. අතට හසුවන මානයේ ගසක් නැත. ඒ හා ම දැඩි භීතියක් ඔහු තුළ හට ගත්තේ ය. තමා වනයෙන් පිට වූයේ නැතිතලාව පාර්ශවයෙන් ද නැතහොත් කඳවුර පිහිටි දිශාවෙන් ද? කඳවුර පිහිටි දෙසින් නම් අන්ධයකු මෙන් ගමන් කරන ඔහු කඳවුර වටා ඉදි කළ වැටේ විදුලි සැර වැද ජීවිතක්ෂයට පත් විය හැකි ය. පෙර දින රාත්‍රියෙහි බැටළුවා විදුලි සැර වැදී මළ සැටි හදිසියේ සිහිපත් වීමෙන් ඔහු වෙව්ළා ගියේ ය. පියවර දෙක තුනක පමණ හෝ දුරක් ඉදිරිය පෙනීම ඔහුට තරමක සහනයක් වී ය. පෙරට විහිදා සිටි දෑත් පහතට දමාගත් හෙතෙම



* ඔවුහු  කිහිප වරක් මෘදු තෘණ පත්  මත පෙරළී ගියහ.

දෑස් පුළුල් ව විවර කොට දෙනෙතින් මීදුම විනිවිදින්නට තැත් කරමින් සෙමින් පෙරට පියවර කිහිපයක් තැබී ය. කම්බි වැට පිහිටියේ රුක් සීමාවට පියවර පණහක් හෝ සැටක් පමණ ඈතින් බැව් ඔහුට මතක ය. තබන සැම පියවරක් ම ඔහු ගැන්නේ ය. ඔහු පියවර සියය ඉක්මවී ය. රුක් සීමාවත් වැටත් අතර එපමණ දුරක් නොමැති බැව් ඔහු ස්ථිර වශයෙන් දනී. එසේ නම් තමා වනයෙන් පිට වී ඇත්තේ කඳවුර දෙසින් නොව තැනිතලාව දිශාවෙනි. එක් අන්තරායකින් මිදුණු බැව් අවබෝධ වීමෙන් තරමක සතුටක් ඔහු තුළ හටගනී. ඔහු නොනැවතී පෙරට ම පියවර මැන්නේ ය.

* * * * *

"දැන් උදේ හයත් පහු වෙලා" යි තමා අසල හිඳ සිටි සගයන්ගේ උරයෙන් සොළවා ඔවුන් අවදි කිරීමට තැත් කරමින් ජැක් කීවේ ය. "නැගිටින්න"

"විහිළු කරන්ට එපා" යි නින්දෙන් බර වූ දෙනෙත යන්තමින් විවර කොට යළි පියා ගනිමින් පීටර් නොඉවසිලි හඬින් මිමිණී ය. "තව ම කළුවර පහ වෙලාවත් නැහැ"

"මේ තියෙන්නේ රෑ කළුවර නොවෙයි" යි ජැක් ඔහුගේ දෑතින් ඇද්දේ ය. "ඇස් හොඳට ඇරලා බලන්ට."

"රෑ කළුවර නොවේ නම් වෙන මොකක් ද?" යි නිදා සිටි ඉරියව් වෙනස් කොට අසල සිටි බැටළුවෙකුගේ ලොමින් පිරි උරය මත හිස හොවා ගනිමින් බිල් චෝදනා කළේ ය. "යන්තම් නින්ද යන්ට ආවා විතරයි"



Scanned with CamScanner

"තවත් නිදාගන්ට වෙලාවක් නැහැ" යි ජැක් කී ය. "මේ තියෙන්නේ රෑ කළුවර නොවෙයි: ඝන මීදුමක්"

"මීදුමක්!" යි පීටර් හා බිල් කලබල වෙමින් හිස් එසවූහ. "නමුත් මීදුමක් නම් ඒක සුදු පාට වෙන්ට එපායැ."

"අප වටේ ඝන ව තියෙන ගස් කොළන් නිසයි මීදුම කළු පාටට පෙනෙන්නේ" යි ජැක් පැහැදිලි කළේ ය. "එළි මහනකට ගියොත් සුදු පාටට පෙනෙයි".

"දැන් වැස්ස නැවතිලා නිසා ඩික් හොයන්ට යමු" යි පීටර් යෝජනා කළේ ය.

"මේ මීදුමේ කොහොම හොයන්ට ද?" යි ජැක් විරුද්ධ වී ය. "මේක ඉක්මනින් ම පහ වේවි. ඊට පස්සෙ හොයන්ට පිටත් වෙමු."

යළිත් වරක් නිසොල්මන් ව සිටි බැටළුවන් අතර හිඳගත් ළමෝ මීදුම පහ ව යන තෙක් බලා සිටින්ට වූවෝ ය.

*     *     *     *

හිරු නැගෙත් ම එතෙක් කැරළි ගැසෙමින් ඝන ව හැමූ මීදුම ක්‍රමයෙන් පහ ව යන්ට වී ය. මීදුම විනිවිද පැමිණි හිරු කිරණ කිහිපයක් තැනිතලාව මත යන්තමින් පතිත විය. ප්‍රථමයෙන් පියවර හත අටක් පමණ ද ඉක්බිති පහළොවක් විස්සක් පමණ ද ඉදිරිය පෙනෙන තරමට මීදුම තුනී වූයේ ය. ඈත වැඩුණු මහ ගස් මුළින් දළ ඡායාවක් සෙයින් ද අනතුරු ව වඩා පැහැදිලි ව ද දර්ශනය වී ය. හිරු කිරණ වඩ වඩා ප්‍රබල වූයෙන් ශීතල පහ වී



Scanned with CamScanner

තරමක උණුසුමක් ඩික්ට දැනුණේ ය.

"යාන්තම් මීදුම පහ වෙන හැඩයි" යි ඔහු තමාට ම මුමුණාගත්තේ ය. "දැන් ඉතින් අනිත් අය හොයාගන්ට ඕනෑ. ඔවුන් කලබල වෙලා ඇති.

මේ සිතිවිල්ල පහළ වන්නා හා ම පියවර පණහක් පමණ ඈතින් හදිසියේ මතු වූ මිනිස් රුවක් තමාට පිටුපා ගමන් කරනු ඔහුට පෙනුණේ ය. එහි අඟ පසඟ මැනවින් දැකිය හැකි තරමට මීදුම පහ ව තිබුණෙන් ඒ පීටර් බැව් ඩික් වහා හැඳින්නේ ය. තම සගයා නිරුපද්‍රිත ව සිටිනු දැකීමෙන් මහත් ප්‍රීතියක් ඔහු තුළ ඉපදිණි.

"පීටර් මා සොයන්ට ඇවිත්" යි ඔහු සිතී ය. අනිකාගේ නම උස් හඬින් මුරගෑමට හටගත් පෙළඹීම හදිසියේ පහළ වූ සිතිවිල්ලක් හේතුකොටගෙන ඔහු මැඩලී ය. "ශබ්ද නැති ව පිටිපස්සෙන් ගිහින් පීටර් බය කරන්ට ඕනෑ" යි තමාට ම මුමුණාගත් හෙතෙම හඬ නොනැගෙන පරිද්දෙන් ඉක්මන් පියවර තබා අනිකා හඹන්නට වූයේ ය. ඔහු තම සගයාට පියවර පහකින් පමණ ආසන්න විය. ඉක්බිති "හලෝ !" යි උස් හඬින් මුරගාමින් දෑත විදා අනිකාගේ උරය අල්ලා ගැනීමට පෙරට පැන්නේ ය.

ඩික්ගේ කෑගෑමෙන් කලබල වූවාක් මෙන් ඔහු විසින් ලුහුබැඳි රුව හදිසියේ පසෙකට විය. ඒ හා ම ඉලක්කය වැරදී ගොස් ඩික් පැමිණි වේගයෙන් ම අනිකා ද පෙරළාගෙන බිම ඇද වැටුණේ ය. ඔවුහු කිහිප වරක් තෙත් වූ මෘදු තණ පත් මත පෙරළී ගියහ. වීදුරු බඳුන් කිහිපයක් එකිනෙක ගැටී ඇතට විසි වනු ශ්‍රවණය වී ය.

"මගෙ ඇඟට කඩා පැන්නේ ඇයි?" යි කිසිවකු විමසනු

ඇසී ගියෙන් ඩික් වහා හිස හරවා තැනි බිමෙහි විසිරුණු බඳුන් කිහිපයක් එක් රැස් කරන අනිකා දෙස බැලී ය. ඉක්බිති දස් අදහාගත නොහැකි ව මෙන් කිහිප වරක් දෙඅත්ලෙන් දෙනෙත් පිස දැම්මේ ය. තමා අබියස සිටින්නේ පීටර් ද නැතහොත් අන් කිසිවකු ද යි ඔහුට නිශ්චිත වශයෙන් සිතාගත නොහැකි විය. අනිකාගේ අත් පා ද සිරුරේ ප්‍රමාණය මෙන් ම මුහුණ ද පීටර්ට බෙහෙවින් සමාන ය. එහෙත් කටහඬ තරමක් වෙනස් ය. අනිකා ඇඳ සිටි ආකාරයේ යන්තමින් ඉරී ගිය ගෙළ තෙක් වැසුණු රත් පැහැති ජර්සියක් පීටර් කිසි විටෙකත් අඳිනු ඔහු දැක නැත. පෙර දින සන්ධ්‍යාවෙහි ගුවන් කඳවුර කරා පැමිණෙන විට පීටර් හැඳ සිටියේ නිල් පැහැති කමිසයක් බැව් ඔහුට හොඳින් මතක ය. එසේ නම් මේ විපර්යාසය කවරක් විය හැකි ද?

"ඇයි මගෙ ඇඟට කඩා පැන්නේ?" යි ඩික් නැගී සිටින්නට තැත් කරනු දුටු පීටර් බඳු තරුණයා යළි විචාළේ ය. "මම හොඳට ම බය වුණා. ඔබට තුවාල නැහැ නේද?"

"නැහැ" යි අනිකා කෙරෙන් දෙනෙත් බැහැර නොකර ම ඩික් එකඟ වී ය. "නමුත් ඔබ පීටර් නොවේද?"

"පීටර්? ඒ කව්ද?"

"ඇයි? අපේ යාළුවා, පීටර්"

"පීටර් කෙනෙක් ගැන මම දන්නේ නැහැ. මගේ නම ජිම්. ඇයි? ඔබේ යාළුවා කියලා මට රැවටුණා ද?"

"ඔව්" යි මනස ව්‍යාකුල වූවකු මෙන් ඩික් හිස සැලී ය. "ඔබත් බොහොම දුරට පීටර්ට සමානයි. ඇඟ පතත් මුහුණත්,



Scanned with CamScanner

ඇවිදින හැටිත්, හැම දෙයක් ම. ඊයෙ රෑ වැස්ස වෙලාවෙ අර කඳවුර ඉදිරිපිට වන ලැහැබෙදි අපි වෙන් වුණා. එළි වෙනකම් මම හිටියේ පඳුරක් ඇතුළෙ. උදේ නැගිට්ටද්දි මීදුම. මම අමාරුවෙන් පාර සොයාගෙන කැලෑවෙන් එළියට ආවා. මීදුම අඩු වෙද්දි මම දැක්කා ඔබ මට තරමක් ඈතින් යනවා. ඉතින් ඔබ පීටර් ය කියල හිතාගෙන බය කරන්ට යි ඇහට පැන්නේ. මට සමාවෙන්න."

"අහා! එහෙනම් ඔබ, රිදී තැන්නේ නිවාඩුව ගත කරන්ට ආ යාළුවන් හතර දෙනාගෙන් එක් කෙනෙක් වෙන්ට ඕනෑ"

"ඔව්, ඔබ කොහොමද ඒ වගක් දන්නේ?"

"ඔය ගොල්ලො එන ගමනේදී අපේ ගොවි පොළට ගිහින් තියෙනවා. මගේ සීයා, මහළු ජෝ, තමා ඔයගොල්ලන් ගැන විස්තර කිව්වේ. දැන් අනිත් අය කොහේද?"

"ඊයෙ රෑ වැස්ස වෙලාවෙදි වෙන් වුණාට පස්සේ දැක්කේ නැහැ. ඔවුන් තවමත් කැලෑවෙ ඇති. ඉක්මනින් ම හොයාගත්තොත් හොඳයි."

"යමු. මමත් එන්නම් උදව් වෙන්ට."

මේ වන විට මීදුම පහ ව ගොස් තිබුණෙන් තැනිතලාවත් ඈත කඳු පෙළත් සූර්යා ලෝකයෙන් දිළුණේ ය. රාත්‍රී රැකවරණය පතා වන වැද සිටි බැටළුවෝ එකා දෙන්නා බැගින් පිටතට පැමිණෙමින් සිටියහ. තෙත් සහිත දීර්ඝ රාත්‍රියකින් පසු ප්‍රමාද වූ උදෑසන ආහාරයක් සොයා පක්ෂීහු රැන් වශයෙන් වනයෙන් ඈතට පියෑඹූහ. අන්ධකාරය ද මීදුම ද පහ වීමෙන් උද්දාමයට පත් තියායෙන් ඈතක සිටි ගව රැළක් උස් හඬින් කෑගෑ ය. මෙපරිද්දෙන්

සමස්ත පරිසරය යළිත් ප්‍රකෘති ස්වභාවයට පත් වෙමින් තිබිණ.

"අන්න මගේ යාළුවෝ" යි වන සීමාවේ ඈත තැනකින් හදිසියේ පිටතට බට ජැක්, බිල් හා පීටර් දක්වමින් ඩික් කෑගෑ ය. තවත් ස්වල්ප වේලාවකින් ම ඔවුහු කැකෝ ගසමින් ද ඉකුත් රාත්‍රියෙහි තමන් මුහුණ පෑ වික්‍රමය පිළිබඳවත් රිය පහත් කළ ආකාරය පිළිබඳවත් සාකච්ඡා කරන්නට වූවෝ ය.

"හා! මට හඳුන්වලා දෙන්ටත් අමතක වුණා" යි පසෙක සිටි ආගන්තුක තරුණයා දෙසට හැරෙමින් ඩික් කීවේ ය. "මේ ජිම්, මහළු ජෝගේ මුණුපුරා. පීටර් ය කියලා මම එයාට රැවටුණු තරමක්."

"ඈත්ත නේන්නම්" යි විස්මයෙන් පුළුල් වූ දෙනෙතින් ජැක් තරුණයා දෙස බැලුවේ ය. "පීටර්ගෙ ඇරපු අතක් නැහැ."

"ඔව්" යි බිල් එකඟ විය. "ගමන බිමන හැඩරුව හැම දෙයක් ම පීටර්ට සමානයි."

"එහෙනම් අර සුරංගනා කථාවල කියන විදියට පුංචි කාලෙදි අතුරුදන් වූ මගේ නිවුන් සොහොයුරා වෙන්ට ඇති" යි තමා වැනි ම වූ නවක සගයාගේ දෑත අල්ලා ගනිමින් පීටර් සිනහ පෑවේ ය.

"ජිම්, උදේ පාන්දර ම තැනිතලාවේ මොනවාද කරන්නෙ?" යි ජැක් තරුණයා දෙස බැලී ය.

"ගුවන් කඳවුරේ ප්‍රධානියාට කිරි ගෙනෙන්නේ මම" යි අතක එල්ලාගෙන සිටි බඳුන් සහිත පැස දක්වමින් ජිම් පිළිතුරු දුන්නේ ය. "අදත් කිරි දීලා ආපහු යද්දියි ඩික් මගේ ඇහට

පැන්නේ."

"ජිම් ඔය කඳවුර ඇතුළට ගිහින් තියෙනවාද?"

"නැහැ. වැටේ කඩුල්ල ළඟට ගියා ම මුරකාරයා ඇවිත් බෝතල් අරගන්නවා. හිස් බෝතල් ගෙනෙනකම් මම ඉන්නේ ගේට්ටුවෙන් පිට. කිසි දවසක ඇතුළට යන්ට අවසර ලැබිලා නැහැ."

"ඔය කඳවුරේ සිද්ධ වෙන දේවල් ජිම් දන්නවාද?"

"නැහැ. ඇයි? මොනවද වෙන්නේ? අපට කියල තියෙන්නෙ මේක රටේ ආරක්ෂාවට හදාපු කඳවුරක් බවයි."

"සිද්ධ වෙන දේවල් නම් අපිත් දන්නේ නැහැ" යි බිල් කීවේ ය. "නමුත් ඔය කඳවුර ගැන අපට ලොකු සැකයක් තියෙනවා. හරියට ම දැනගන්ට නම් කඳවුර ඇතුළට ගිහින් බලන්ට ඕනෑ."

"ඒක නම් කවදාවත් කරන්ට බැහැ" යි ජිම් හිස සැළුවේ ය. "ඔය තරම්වත් කඳවුර කිට්ටුවට යන්නේ මම විතරයි. වෙන කිසි ම කෙනෙකුට කිට්ටු වෙන්ටවත් අවසර නැහැ."

"මට නම් හොඳට ම නිදිමතයි." යි ඩික් කිහිප වරක් දෑස් පිස දම්මේ ය. "ඊයෙ රෑ හරියකට නින්දක් ලැබුණේ නැහැ"

"එහෙනම් අපි හැමෝ ම දැන් කුඩාරමට යමු. ජිම් එනවද අපිත් එක්ක යන්ට."

"දැන් බැහැ" යි තරුණයා ආරාධනය ප්‍රතික්ෂේප කළේ ය. "බැටළුවන් ගැන මට බලන්ට තියෙනවා. හවස එන්නම්."

ස්වකීය කූඩාරම පිහිටි ස්ථානය අනිකා හට විස්තර කළ සිව් මිතුරෝ පෙර දින පැමිණි මගෙහි ම ගමන් කොට සුළු උදෑසන ආහාරයකින් ඉක්බිති නින්දට වැටුණෝ ය.



Scanned with CamScanner

# 6

"අන්න ජිම් එනවා" යි කුඩාරම අබියස කිසි කටයුත්තක නිතර ව හුන් බිල් කඳු ගැටය බසින තරුණයා දක්වමින් කෑගැවේ ය. තවත් ස්වල්ප වේලාවකින් ම සිව් මිතුරෝ ස්වකීය නවක සගයා ද සමඟ තේ පානය සඳහා තණ බිමේ වැඩුණු විශාල වෘක්ෂයක සෙවණෙහි හිඳගත්තෝ ය.

'ජිම් ඉස්කෝලෙ යන්නෙ නැද්ද?" යි පීටර් දුම් දමන තේ කෝප්පයක් අනිකා වෙත පෑවේ ය.

'නැහැ" යි ජිම් මද සිනහවක් නඟමින් පිළිතුරු දිනි. "මේ කිට්ටුවක ඉස්කෝලයක් නැහැ නොවැ. අනික, ඉගෙන ගත්තා ය කියලා අපි මෙහෙ මොනවා කරන්ට ද?"

"එතකොට ජිම්ගේ අම්ම තාත්ත?"

"ඒ ගොල්ලො මේ පළාත හැර දමලා යන්ට ගියා. නමුත්

මෙහෙ නිස්කලංක පරිසරයට කැමති නිසා මම නොගිහින් සීයා එක්ක නතර වුණා. ගොවි පොළේ වැඩත් බැටළුවන්ගේ වැඩත් මට ලොකු විනෝදයක්''

මේ මොහොතේ අහසේ බොහෝ ඉහළින් ගමන් ගන්නා යානයක හඬ ඔවුන්ගේ සවනත වැකී ගියේ ය. හඬ නැගුණු දෙසට දෙනෙත යොමු කළ ද යාත්‍රාවක සේයාවකුදු ඔවුන්ට පෙනුණේ නැත.

''ගුවන් කඳවුරේ හෙලිකොප්ටරේ වෙන්ට ඕනෑ'' යි මඳ වේලාවක් ආකාශය පිරික්සමින් සිටි ජිම් කීවේ ය. ''හැමදාම උදේට ඕක පිටත් වෙලා ගිහින් හවසට ආපහු එනවා.''

''ඔය ගුවන් කඳවුර පටන් ගත් හැටි ජිම් දන්නවද?''

''ඔව්. මීට අවුරුදු දෙකකට විතර උඩදි තමයි පටන් ගත්තේ. මුලින් ම කම්බි වැටකින් කඳු පාමුලේ තුන් පැත්තක් ආවරණය කළා. ඉතිරි පැත්තෙන් කිසි කෙනෙකුට ඔය කන්ද නගින්ට බැහැ. ඊට පස්සේ කඳවුර කිට්ටුවට කිසිවකු ඒම තහනම් කරලා නීති පැනෙව්වා. ඔය අහල පහළ ඒ දවස්වල ගොවි පොළක් තිබුණා. නමුත් කඳවුරේ ආරක්ෂාවට තර්ජනයක් ය කියලා ඒකෙ හිටි මිනිස්සු ඔවුන් පිට මං කළා. අපේ ගොවි පොළටත් ඒක ම කරන්ට ආවත් සීයා විරුද්ධ වුණා. ඊට පස්සේ නම් අපට කරදරයක් වුණේ නැහැ. කඳවුරේ ප්‍රධානියා මිටි තරබාරු මිනිහෙක්. නිතර ම ගමන් බිමන් යන්නේ හෙලිකොප්ටරෙන්''

''ගුවන් කඳවුරට රහසින් ඇතුල් වෙන්ට ක්‍රමයක් නැද්ද?'' යි ඩික් විමසුම් බැල්මක් ජිම් වෙත හෙළුවේ ය.



Scanned with CamScanner

"කිසි ම ක්‍රමයක් නැහැ. දවස පුරා ම මුරකාරයෙක් වැ අද්දරින් එහාටත් මෙහාටත් සක්මන් කරනවා. රැටත් ඔය විධියට ම මුර කරනවා ඇති."

"නැහැ. රැට මුර කරන්නේ නැහැ" යි ජැක් ස්ථිර හඬින් කීවේ ය. "ඒ බව අපි හොඳින් ම දැක්කා. මුර කරනවා වෙනුවට ඔවුන් කරන්නේ කම්බි වැටට විදුලිය කාන්දු කිරීමයි. ඔය විදුලි පරිපථය ක්‍රියාත්මක කරන්නේ කණුවක සවි කළ ලීවරයක් පහතට ඇදීමෙන්"

"ඔය අදහස හරි වෙන්ට ඕනෑ" යි අමතක වූ කිසිවක් සිහිපත් කිරීමට මෙන් මොහොතක් නිහඬ ව සිටි ජිම් කල්පනාකාරී හඬින් දන් වී ය. "දවසක් මම වෙනදට කලින් කිරි අරගෙන ආවා. මම ගස් සීමාවෙන් පිට වෙලා කඩුල්ල පැත්තට එද්දි, වහා ම නතර වෙන්ට ය, කියල ඇතුළෙ හිටි මුරකාරයා කෑගැහුවා. එයා කණුවක සවි කළ ලීවරයක් ඉහළට එසෙව්වට පස්සෙයි මට ළහට යන්ට අවසර ලැබුණේ."

"එහෙනම් අපේ සැකය හරි" යි ජැක් තෘප්තිමත් සිනහවක් පෑවේ ය. "රැට විදුලිය කාන්දු කරලා උදේට ඉවත් කරනවා. මුර කරන්ට පටන් ගන්නේ ඊට පස්සේ."

"එහෙම නම් අපට ඔය කඳවුරට ඇතුල් වෙන්ට ක්‍රමයක් ඇත්තේ ම නැද්ද?" යි පිළිතුරු අපේක්ෂාවෙන් ඩික් සෙස්සන්ගේ මුහුණු බැලුවේ ය. "නැති වෙන්ට බැහැ. මීට වඩා භයානක තැන්වලට අපි මීට කලින් ගිහින් තියෙනවා නොවැ."

"ජිම් උදේට කඳවුරට කිරි භාර දෙන හැටි බලාගන්ට ලැබුණොත් සමහර විට ඔය ප්‍රශ්නෙට උත්තරයක් හොයාගන්ට

හැකි වේවි." යි මොහොතක් සිතිවිල්ලෙහි නියැළුණු ජැක් කීවේ ය.

"ඒක අමාරු නැහැ" යි ජිම් දැන්වී ය. "හෙට උදේ පාන්දර ම ඇවිත් අර රුක් ගොමුව කිට්ටුවදී මා හමුවෙන්ට."

"මීදුම නොතිබ්බොත් ඒක කරන්ට පුළුවනි."

'නැහැ. හෙට මීදුම තියෙන එකක් නැහැ. අහස හොඳට ම පැහැදිලියි. ඒකෙන් අදහස් වෙන්නේ අද රෑ නොවහින බවයි. එහෙම වුණොත් හෙට මීදුමක් ඇති වෙන්නේ නැහැ."

පසු දින අළුයම රුක් සීමාව ආසන්නයේදී සිව් මිතුරන් මුණගැසීමට ගිවිසගත් ජිම් රාත්‍රී අන්ධකාරය පැතිරෙන්නට නොබෝ වේලාවකට මත්තෙන් ඔවුන්ගෙන් සමුගත්තේ ය.

* * * *

ඉක්බිති දින හිමිදිරියෙහි ඔවුන් රුක් සීමාව අද්දරදී ජිම් මුණගැසෙන විට රාත්‍රී අන්ධකාරය මැකී තිබුණේ යන්තම්ති. වැඩි හඬක් නොනගා වන ලැහැබ තුළින් ගමන් කළ ඔවුහු ඉක්මනින් ම එහි ඇතුළු සීමාවට පැමිණ කඳවුර පිරික්සූහ. ඒ වන විටත් මුර සෙබළා ස්වකීය දින චර්යාවේ ප්‍රධානතම අංගය වූ වැට අද්දරින් සක්මන් කිරීම ආරම්භ කොට තිබුණේ ය.

"මම දැන් කඩුල්ල ළඟට යනවා" යි ජිම් රහස් හඬින් දැන්වී ය. "ඔය ගොල්ලො පෙනෙන්ට එන්ට එපා."

තවත් මොහොතකින් රුක් ගොමුවෙන් පිටතට බට ජිම් විවේකී පියවරෙන් වැටෙහි කඩුල්ල දෙසට ගමන් කරන්නට වූයෙන්

සිව් මිතුරෝ සන ව වැඩුණු පඳුරක සෙවණෙහි සිට ඔහු දෙස පරීක්ෂාවෙන් බලා සිටියෝ ය. තරුණයා කඩුල්ල සමීපයට පැමිණෙනුත් මුරකරු යතුරකින් එහි අගුල විවර කරනුත් ඔවුන්ට පෙනිණ. අනතුරු ව උරයෙහි එල්ලාගෙන පැමිණි පැසකින් පිටතට ගත් කිරි බඳුන් යුගලයක් ජිම් විසින් මුරකරු හට භාර කරන ලදින් ඔහු එය ද රැගෙන ඉක්මන් ගමනින් මෑතින් පිහිටි දෑවමය ගොඩනැගිල්ලකට ඇතුලු විය. බඳුන් සිස් කොට ඔහු පෙරළා පැමිණියේ ඊට මිනිත්තු දෙකකට පමණ පසු ව ය. හිස් බඳුන් පැස තුළ දමාගත් තරුණයා යළි රුක් සීමාවට ඇතුළු වූ අතර මුරකරු කඩුල්ල අගුල් ලා සක්මන ආරම්භ කළේ ය.

සිව් මිතුරන් ජිම් ද සමඟ යළි කුඩාරම කරා පැමිණෙන විට සූර්යාලෝකය මැනවින් පැතිර තිබිණ. උණුසුම මිශ්‍රිත මද සුළඟක් ඔවුන්ගේ සිරුරු සනහමින් හමා ගියේ ය. තැන්න හරහා ගලන නදියේ දිය සැඩ හිරු රැස් වැද රිදී පැහැයෙන් දිළිණ. පක්ෂි රැන් කිහිපයක් උදෑසන ආහාරය සොයා ඈතින් පෙනෙන ගොහොරු බිම දිශාභිමුඛ ව පියෑඹී ය. මෑත තුරු ගොමුවල මල් අතර සරන බිඟුන්ගේ ගුමු ගුමුවත් කුඩා පක්ෂීන්ගේ මිහිරි නාදයත් තවත් එක් සුන්දර දිනයක ඇරඹුම කියාපෑ ය.

එහෙත් මෙදින ඒ කිසිත් සිව් මිතුරන්ගේ සැලකිල්ලට බඳුන් වූයේ නැත. බැරෑරුම් මුහුණින් කුඩාරම අබියස හිඳගත් ඔවුහු කළවුර අසලදී තමන් දුටු සියල්ල එකිනෙක ගෙන සාකච්ඡා කරන්නට වූවෝ ය.

"අද අපි යද්දිත් විදුලි කාන්දුව ක්‍රියා විරහිත කරලා තිබුණා" යි ඩික් කී ය.

"ඔව්. ඒකෙන් පෙනෙන්නේ අමතක වීමකින් හැරෙන්ට එළිය



Scanned with CamScanner

වැටෙන්ට කලින් ඔවුන් විදුලිය විසන්ධි කරන බවයි" යි බිල් එකඟ විය.

"ඊට වඩා වැදගත් දෙයක් මම දක්කා" යි පීටර් කීවේ ය. මුරකාරයා කඩුල්ල ඇරලා යතුර අගුළේ ම තියෙද්දියි බෝතල් අරගෙන ඇතුළට ගියේ. ඒ අතරේ යතුර හොරකම් කරගන්ට ලැබුණොත් ඒක අපට ප්‍රයෝජනවත් වේවි."

"නමුත් ඒක භයානකයි" යි ඩික් හරස් වී ය. "මුරකාරයා ආපහු ඇවිත් යතුර එතන නැති බව දක්කා ම ඔහු ජිම් අල්ලා ගනීවි. ඒකෙන් අමාරුවේ වැටෙන්නේ ජිම්."

"ඊට වඩා හොඳ ක්‍රමයක් මට කල්පනා වුණා" යි මදක් කල්පනාවෙහි නිරත ව සිටි ජැක් හදිසියේ දන්වී ය. "අපේ පීටර් අඟ පසහෙනුත් හැඩ රුවෙනුත් ජිම්ට හොඳට ම සමානයි. ඉතින් අපට මෙහෙම දෙයක් කරන්ට පුළුවනි. ජිම්ගේ ඇඳුම් හැඳගෙන ඒ වගේ වෙස් වළාගෙන පීටර් කිරි බෝතල් කඩුල්ල ළඟට ගෙනියනවා. ඒ ජිම් නොවේ ය කියලා මුරකාරයා සැක කරන එකක් නැහැ. මිනිහා කඩුල්ල ඇරලා බෝතල් ඇතුළට ගෙන ගියා ම පීටර් යතුර අරගෙන සබන් කෑල්ලක නැතිනම් මැටි පිඩක ඒක ඔබලා යතුරේ සටහනක් ගන්නවා. ඊට පස්සේ යතුර ආපහු අගුලට ම දමනවා. මිනිහා ආපහු එන්ට කලින් ඔය වැඩේ කරන්ට ලැබෙන්නේ මිනිත්තු දෙකයි. ඉක්මන් කළොත් ඔය කාලය ප්‍රමාණවත්"

"හොඳ අදහස" යි සෙස්සෝ ප්‍රීතියෙන් මුරගෑහ.

"නමුත් ඔය සැලැස්මේ පොඩි දෝෂයක් තියෙනවා" යි ජැක් යළි කථා කළේ ය. "යතුරේ සටහනක් ගත්තත් අපි කොහොමද ඒ විධියේ යතුරක් කපා ගන්නේ. යතුරු කපන තැනක් හොයන්ට



Scanned with CamScanner

බොහොම ඈත නගරෙකට යන්ට වෙයි".

"ඒ ගැන කලබල වෙන්ට එපා" යි මෙහිදී ජිම් ඔවුන් අස්වැසී ය. "අපේ ගොවිපොළ කිට්ටුව තියෙනවා විල්ගේ කම්මල. අපට අවශ්‍ය සෑම ආයුධයක් ම හදන්නේ එතන. ආයුධ හැරෙන්ට යතුරු කපන්ටත් විල්ට පුළුවනි. මිනිහා හොඳ දක්ෂයා. ඔය වැඩෙත් එයාගෙන් ම කරගන්ට පුළුවනි."

"අපූරුයි " යි සියල්ලෝ ම උස් හඬින් කෑගැවෝ ය. "එහෙම නම් හෙට ම වැඩේ පටන් ගමු."

"යතුරක් තිබුණත් අපි කොහොමද කඳවුරට ඇතුල් වෙන්නේ" යි ඩික් ප්‍රශ්නයක් නැඟී ය. "දවල්ට මුරකාරයා, රෑට විදුලිය"

'බොහොම පහසුයි" යි ජැක් මදහසක් නැංවී ය. "විදුලිය කාන්දු කරන ලීවරය සවි කරලා තියෙන කණුව කිට්ටුව වැටට පිටතින් උස ගහක් තියෙනවා. ඒකෙ අත්තක් ඔය කණුව දිහාට වැටට ඉහළින් නෙරලා තියෙනවා මම දැක්කා. කළුවර වැටුණට පස්සෙ අපෙන් එක් කෙනෙකුට පුළුවනි, වැටේ නොවැදී ගහට නැගලා අත්ත දිගේ ගිහින් ලීවරයට තොණ්ඩුවක් දමලා ඉහළට ඔසවන්ට. ඒ විදියට විදුලිය විසන්ධි කරලා යතුරෙන් කඩුල්ල ඇරගෙන කඳවුරට ඇතුල් වෙනවා. කළුවර නිසා කිසි කෙනෙක් අප දකින එකක් නැහැ."

# 7

කතිකා කොටගත් පරිදි ඉක්බිති හිම්දිරියේ සිව් මිතුරන් පැමිණෙන විටත් ඔවුන් අපේක්ෂාවෙන් ජිම් ගුවන් කඳවුර අබියස වන ලැහැබෙහි නතර ව සිටියේ ය. එකිනෙකාගේ ඇඳුම් හුවමාරු කොට හැඳගැනීමට පීටර්ටත් ජිම්ටත් ගත වූයේ මිනිත්තු කිහිපයක් පමණෙකි. තමා ජිම් නොවන බැව් මුරභටයා විසින් හඳුනාදෝ යන සැකයෙන් පීටර් ජිම්ගේ හිස් වැස්ම මුහුණේ ඉහළ පෙදෙස යන්තමින් ආවරණය වන පරිද්දෙන් පහතට ඇද්දේ ය. ඉක්බිති තරුණයා රැගෙන පැමිණි කිරි බඳුන් අඩංගු පැස උරයෙහි රඳවාගත් හෙතෙම තමන් විසින් සකසන ලද මෘදු මැටි පිඩ ප්‍රවේශමෙන් එතුළ බහාළී ය.

"දන් නම් පීටර්ගේත් ජිම්ගේත් වෙනස හඳුනාගන්ට බැරි තරම්." යි ජැක් තම සගයා දෙස ප්‍රශංසාත්මක බැල්මක් හෙළුවේ ය. "අපේ කටයුත්ත සාර්ථක වේවි."

වහ වහා වන ලැහැබ තරණය කළ ඔවුහු එහි ඇතුළු

සීමාවට පැමිණ අඳුරු රුක් සෙවණක සැඟ වී කඳවුර පිරික්සූහ.

ඒ වන විටත් සූර්‍ය්‍යා කඳවුරට පසු බිමින් වැඩුණු කඳු ගැටය ඉක්මවා නොතිබුණෙන් කඳවුර තුළ පැවතියේ තරමක අන්ධකාරයකි. එතෙකුදු වුව වැට අද්දරින් ඔබ මොබ සක්මන් කරන මුරභටයා ඔවුන්ට පැහැදිලි ව පෙනුණේ ය. ස්වකීය සගයන්ගේ සුබ පැතීම් හා ධෛර්යය වදන් දෙසවනෙහි දෝංකාර දෙමින් ම රුක් සීමාවෙන් පිටතට බට පීටර් පැස ද එල්ලාගෙන කඩුල්ල දෙසට පා එසවී ය. තවත් මොහොතකින් කඩුල්ල විවර කළ මුර භටයා පීටර් විසින් පැසෙන් පිටතට ගන්නා ලද කිරි බඳුන් දෝතින් ගෙන ඈත අන්තයේ පිහිටි ගොඩනැගිල්ලක් දෙසට නොපෙනී ගියේ ය. ඒ හා ම පීටර් දකුණත දිගුකොට අගුලෙන් යතුර මුදාගනුත් පැසෙහි වූ මැටි පිඩ මත එය තබා තෙරපනුත් සෙස්සෝ ගැහෙන හදින් යුතු ව බලා සිටියහ. යතුරේ හැඩය මැටි පිඩෙහි සටහන් කළ පීටර් එය යළි අගුල තුළ රඳවන්නට සැරසෙත් ම සිදු වූයේ කිසි සෙයිනුත් අපේක්ෂා නොකළකි.

පීටර්ගේ සුරතින් ගිළිහුණු යතුර තණ බිම මතට ඇද වැටුණේ ය.

"විනාශයි" යි රුක් සෙවණෙහි සිටි ජැක් පහත් හඬින් මිමිණී ය. "යතුර වැටුණා"

"ඒක මට පෙනෙනවා" යි ඩික් කීවේ ය. "අර තණ බිස්ස උඩ ම තියෙන්නේ."

ඔහු විසින් පවසන ලද්දේ සත්‍යයකි. මක් නිසා ද යත් කඳු ගැටය ඉහළින් මතු වූ සූර්‍ය්‍යාගේ ප්‍රථම කිරණ වැදී තණ පත් මත රැඳුණු යතුර රිදී පැහැයෙන් දිලෙන්නට වූ හෙයිනි. එහෙත් පීටර් ඒ



Scanned with CamScanner

දුටු බවක් නොපෙනිණ. යතුර සොයා ඊට ප්‍රතිවිරුද්ධ දෙසට හැරුණු හෙතෙම නැවී තණ පත් අතර කලබලයෙන් අතැඹිලි මෙහෙයවන්ට වූයේ ය.

"මේ මිනිහා මොනවා කරනවාද? " යි බිල් කෝපයෙන් හා භීතියෙන් කොඳුළේ ය. "අත ළඟ ම තියෙන යතුර පෙනෙන්නේ නැද්ද?"

"යතුර හිරු එළියෙන් දිලෙනවා ඈතට පෙනුණත් ළඟට නොපෙනෙනවා ඇති" යි ජැක් පැවසී ය.

මේ වන විට ළමුන් පසු වූයේ භීතියෙන් මුසපත් සිතිනි. වනය පුරා දෝංකාර දෙන හඬින් තම හදවත් ගැසෙන්නාක් මෙන් ඔවුන්ට දැනුණේ ය. පරිසරයේ දැඩි සිසිල ද මැඩ සිහින් ඩා බිඳු සිරුරු පුරා වැගිරෙන්ට වී ය. යතුර ඈතින් පෙනුණු මුත් මුර භටයා පෙරළා පැමිණේ ය යන සැකය හේතුකොටගෙන පීටර්ගේ සහායට යාමට ඔවුහු පැකිළුණහ.

"අන්න මුරකාරයා එනවා" යි ඈත ගොඩනැගිල්ලේ දොරටුවක් විවර වනු දුටු ඩික් ගැහෙන හඬින් මිමිණී ය. "පීටර් යතුර සොරකම් කළ බව අහුවෙයි".

ඔහු මෙසේ පවසන්නා හා ම පීටර් තම දෙපා අසල තණ පත් අතර රැඳුණු යතුර දිටී ය. එය අසුලා අගුල තුළ රුවන්නට ඔහුට ගත වූයේ තවත් තත්පර කිහිපයකි. ඉක්බිති හෙතෙම ගත වූ අති බිහිසුණු මිනිත්තුවක කාලය තුළ භීතියෙන් සසල වූ හදවතේ වේගවත් ස්පන්දන හඬ මුර භටයාට ශ්‍රවණය වේ ද යි සැකයෙන් මෙන් ළය මත සුරත තබා ගත්තේ ය.

එහෙත් සෙබලාට කිසිදු වෙනසක් දැනුණු බවක් නොපෙනිණ.



Scanned with CamScanner

හිස් බඳුන් පීටර් හට භාර කළ හෙතෙම කඩුල්ල වසා යතුර කබා සාක්කුවක බහාළු අතර පීටර් රුක් සෙවණක සැඟ වී සිටි සෙස්සන් හා එක් වී ය.

"අපි බය වුණු තරමක්" යි නළල් තලයෙන් වැගිරෙන දහඩිය දෙඅත්ලෙන් පිස දමමින් ජැක් කීවේ ය.

"ඔව්. අපි නම් හිතුවේ අහුවුණා ම තමා කියලයි." යි බිල් එකඟ වී ය.

"කකුල් ළඟ ම තිබුණු යතුර දැක්කේ නැද්ද?" යි ඩික් විචාළේ ය. "අපට නම් ඈතටත් පෙනුණා."

"හිතේ කලබලය නිසා මුලින් නොදකින්ට ඇති" යි පීටර් නොසන්සුන් සිනහවක් පෑවේ ය. ගත වූ කෙටි කාලය තුළ මුහුණ දුන් අති බිහිසුණු අත්දැකීම ඔහු බෙහෙවින් සසල කළ බවක් පෙනිණ. අනතුරට පත් වීමට තමා කෙතෙක් ආසන්න වී ද යි සිතත් ම ඔහුගේ සිරුර යළි යළිත් දහඩියෙන් පෙඟී ගියේ ය.

"කොහොම වුණත් අනතුරක් සිද්ධ වුණේ නැහැ නොවැ" යි එතෙක් නිහඬ ව සිටි ජිම් කථාවට එක් විය.

"ඔව්. ඒක නම් ලොකු සහනයක් තමා" යි ජැක් එකඟ වූයේ ය. "පීටර්, අපි බලමු අර යතුරේ සටහන කොහොමද කියලා"

පීටර් මැටි පිඩ පැසෙන් පිටතට ගෙන සෙස්සන් හට පෑවේ ය. යතුරක කටු චිත්‍රයක් එහි මැනවින් සටහන් ව තිබිණ.

"බොහොම පැහැදිලි ව තියෙනවා' යි ඩික් කීවේ ය.



* වැට අද්දරින් සක්මන් කළ මුර භටයා හැරෙන්නට අන් කිසිවකු ඔවුන් විසින් නොදක්නා ලදී.

Scanned with CamScanner

"ඔව්. දූන් ඇත්තේ ඒකෙන් යතුරක් කැපීමේ කටයුත්තයි"

"විල්ගේ කම්මලට අපි දූන් ම ම යමු" යි ජිම් පෙරමුණ ගත්තේ ය.

සැතපුමක පමණ මග ගෙවා ඔවුන් පැමිණෙන විට කම්මල්කරු ස්වකීය දෛනික කටයුතු ආරම්භ කොට තිබිණ. පෙරටුව පැමිණෙන ජිම් දුර තබා ම හඳුනාගත් හෙතෙම ප්‍රීතිමත් සිනහවක් පා ළමුන් සුහද ව පිළිගත්තේ ය.

"ජිම්ට අළුත් මිත්‍රයො හම්බ වෙලා හැඩයි" යි විල් කී ය. "රිදී තැන්නෙ නිවාඩුව ගත කරන්ට ආ ලන්ඩන් ළමයි වෙන්ට ඇති. මහළු ජෝ ඔයගොල්ලො ගැන මට කිව්වා."

පණස් විය ඉක්මවා සිටි විල් හැඩි දැඩි සිරුරු ඇත්තෙකි. නිරාවරණය වූ ඔහුගේ අයෝමය උඩුකය හර්කියුලිස් නමැති පැරණි ග්‍රීක දෙවියාගේ රූපය ළමුන් හට සිහි ගැන්වී ය. සිරුර හැඩි දැඩි මුත් මුහුණ ද දෙනෙත ද කාරුණික ය. මුව අයා සිනාසෙන විට පූර්ණ දත් දෙපෙළ සුදු පැහැයෙන් දිළුණේ ය. මිතුරකු වශයෙන් ඔහු කදිම මිනිසකු විය හැකැ යි ළමෝ ක්ෂණික ව නිගමනය කළාහ.

"ඉතින් මේ දරුවන්ට මගෙන් මොකක්ද කෙරෙන්ට ඕනෑ" යි විල් සිව් මිතුරන් දෙස විමසුම් බැල්මක් හෙළී ය.

"මේ සටහනේ පෙනෙන හැඩයේ යතුරක් කපා ගන්ට පුළුවනිද?" යි ජැක් මැටි පිඩ අනිකා වෙත පෑවේ ය.

"ෂහ් ! අපූරු වැඩක්" යි මැටි පිඩ පිරික්සමින් විල් කී ය.



Scanned with CamScanner

"සටහන බොහොම පැහැදිලියි. යතුරක් ඉක්මනින් ම කපා දෙන්ට පුළුවනි."

වහා ක්‍රියාත්මක වූ හෙතෙම පැයක් ගෙවෙන්ට ද ප්‍රථම කදිම තිමාවෙන් යුතු යතුරක් සාදා නිම කළේ ය.

"මුල් යතුරට කිසි ම වෙනසක් නැහැ" යි ස්වකීය නිර්මාණය පිරික්සමින් ඔහු කී ය. "මේක හරියන්නෙ නැහැ කියාගෙන නම් එන්ට එපා. මේක මුල් යතුරට සමාන බව මම දිව්රලා කියන්නම්."

කම්මල් කරුගේ මිල ගෙවා දමූ ළමෝ ඔහුට ස්තුති කොට ජිම් ද සමඟ කම්මලෙන් පිටතට බැස්සාහ.

# 8

එදින සන්ධ්‍යාවෙහි පිම් ද කැඳවාගෙන වන ලැහැබ තරණය කළ සිව් මිතුරෝ එහි ඇතුළු සීමාවට පිවිස සැඟ ව ගත්තාහ. කඳු ගැටයේ පිටතට නෙරා සිටි පියස්ස සෙවණෙහි හෙලිකොප්ටර් යානය සුපුරුදු පරිදි නතර කොට තිබුණු අතර වැට අද්දරින් සක්මන් කළ මුර භටයා හැරෙන්නට අන් කිසිවකු ඔවුන් විසින් නොදක්නා ලදී.

තවත් එක් දිනයක තිමාව සනිටුහන් කරමින් සූර්‍ය ක්ෂිතිජය දෙසට නැඹුරු වූයෙන් ආකාශයේ දීප්තිය ක්‍රමයෙන් මැකී ගොස් මද රත් පැහැයක් ඒ වසා පැතිරෙන්ට වී ය. වන ලැහැබේ රාත්‍රී ඨකවරණය පතා ගොහොරු බිම දෙසින් පැමිණෙන පක්ෂි රැන් කිහිපයක් තන් තන්හි දිස් වූයේ ය. ඇතත් මැතත් පඳුරු සළමින් සැදෑ පවන සෙමින් හමා ගියේ ය. බැස යන හිරු පශ්චාත්භාග කොටගත් කඳු ගැටයේ ඡායාව හේතුකොටගෙන කඳවුර අවට භූමිය සෙසු පෙදෙසට වඩා අඳුරු වී ය. නන් දෙසින් පැමිණි පක්ෂීන් වන ලැහැබේ තුරු වදුළු අතරට වදින හඬ ශ්‍රවණය වූයේ



Scanned with CamScanner

ය. සූර්‍ය බටහිර ක්ෂිතිජය තුළ සැඟ වී යන්නට ආසන්න වත් ම කළු පැහැති ඝන ඇතිරිල්ලකින් වසන ලද්දාක් මෙන් ප්‍රථමයෙන් පෙරදිග ආකාශයත් ඉක්බිති සමස්ත අහස් කුසත් අඳුරු වූ අතර ක්ෂිතිජයෙහි පමණක් මඳ රත් පැහැයක් ශේෂ වී ය. අනතුරු ව ඒ ද මුළුමනින් මැකී ගියේ ය. රාත්‍රී අන්ධකාරය ඝන වැස්මක් සෙයින් පරිසරය වෙළා ගත්තේ ය.

මේ අතර මුර භටයා විදුලිය කාන්දු කරවන ලීවරය පහතට ඇද කඳවුර දෙසට ඇදෙනු ළමුන්ට පෙනිණ. දොරටුවක් හැර කිසි ගොඩනැගිල්ලකට ඔහු පිවිසි බැව් හඟවමින් ආලෝක චතුරශ්‍රයක් ඇතින් පෙනී නොපෙනී ගියේ ය.

"දැන් වෙලාව හතයි" යි කුඩා විදුලි පන්දමේ ආලෝකයෙන් අත් ඔරලෝසුව පිරික්සමින් ජැක් තිහැඩියාව බින්දේ ය. "තවත් පැයක් විතර මෙතන ම ඉන්ට වෙයි."

"හැකි ඉක්මනින් අපේ වික්‍රමය පටන් ගත්තොත් හොඳයි" යි ඩික් මිමිණී ය. 'මේ බලා හිඳීම මා නොසන්සුන් කරනවා.ඒත් තව කළුවර වැටුණා මදි."

ඔවුහු යළිත් වරක් තිහඬ වූවෝ ය. වන ලැහැබ වසාගත් ගැඹුරු නිශ්ශබ්දතාවය විටින් විට යන්තමින් බිඳී ගියේ ඵලයක් ගිළිහී බිම වැටෙන හඬින්, නැතහොත් ගසක වවුලන්ගේ පොරකෑමෙනි.

පැය භාගයක් ගෙවී ගියේ ය. පැයක් ගත විය. අවට අන්ධකාරය තව තවත් තීව්‍ර කරවමින් කළු වළා ගැබක් අහස් කුස වසා පැතිරෙන්ට වී ය.

රාත්‍රී අට පමණ වන විට ළමුන්ගේ ඉවසීම, සීමාව ඉක්මවා

යමින් තිබිණ. ඔවුන්ට අවශ්‍ය වූයේ අප්‍රමාද ව ම ස්වකීය රා
වික්‍රමය ආරම්භ කිරීමට ය.

"දැන් කළුවර වැටුණා ඇති" යි හිඳ සිටි තැනින් නැගී සිටිමින් ජැක් දන්වී ය. "වැඩ පටන් ගනිමු."

සියල්ලෝ ම නැගී ජැක් පෙරටුකොටගෙන අඳුරු ඡායා පරිද්දෙන් මැතින් පිහිටි කඩුල්ල දෙසට දෙපා එසවූහ.

"කවුද ගහට නැගලා ලීවරය ඔසවන්නේ?" යි වැට අසලට පැමිණි ඉක්බිති පීටර් රහස් හඬින් ප්‍රශ්න කළේ ය.

"මට පුළුවනි" යි ජිම් ඉදිරිපත් විය. "ගස් නගින්ට ඔය ගොල්ලන්ට වඩා මට පුරුදුයි."

"එහෙනම් ප්‍රවේශම් වෙන්ට" යි ජැක් අනතුරු හැඟවී ය. "යන්තමින්වත් වැටේ වදින්ට එපා."

ලීවරය සවි කළ කණුව ආසන්නයේ වැටට පිටතින් වැඩුණු මහ ගසට අපහසුවකින් තොර ව නැගගත් ජිම් කඳවුර තුළට විහිදෙන ශාඛාවක් ඔස්සේ සෙමින් පෙරට ඇදුණේ ය. කණුවට එක එල්ලේ ඉහළින් පිහිටි ස්ථානයකට පැමිණි හෙතෙම නතර ව තමා රැගෙන ආ කඹ කැබැල්ලේ එක් අන්තයක තොණ්ඩුවක් සැකසී ය. තොණ්ඩුව සහිත අග ප්‍රවේශමෙන් පහත් කොට ලීවරය එහි දවටා ඉහළට එසවීමට ඔහුට ගත වූයේ තවත් මිනිත්තු කිහිපයක් පමණකි.

"දැන් හරි" යි ගසෙන් බැසගත් ජිම් සෙස්සන් හා එක් විය. "ලීවරය එසවුණා. කඳවුරට ඇතුල් වෙමු."

විල් විසින් සාදා දෙන ලද යතුරෙන් කඩුල්ල හැරගත් ඔවුහු කඳවුරට ඇතුළු ව කඳු ගැටයට යා ව ඉදි කළ ගොඩනැගිල්ල දෙසට පා ඔසවන්ට වූවෝ ය. හිසට ඉහළින් පියාසර කළ නිශා පක්ෂියකු හැරෙන්නට ඔවුන්ගේ රහසිගත ගමන දුටුවෙක් නොවී ය. ක්‍රමයෙන් ඔවුහු ගොඩනැගිල්ලට ආසන්න වූවෝ ය.

''ෂ්! මොකක්ද ඒ ශබ්දෙ?' යි හදිසියේ නතර වෙමින් ඩික් රහස් හඬින් විචාළේ ය.

මොහොතක් නතර ව සවන් යොමු කළ ඔවුන්ට ඒකාකාරී ව නැගෙන තීව්‍ර හඬක් ශ්‍රවණය වී ය. එය ගොඩනැගිල්ල තුළින් නික්මෙන්නාක් මෙන් ඔවුන්ට දැනුණේ ය.

''කුඩාරමේදී එදා රෑ දැනුණ දෙදරීම වගේ ශබ්දයක්' යි බිල් කොඳුළේ ය.

''ඔව්. එදා දැනුණා. අද ඇහෙනවා. ශබ්දෙ පිට වෙන්නේ මේ ගොඩනැගිල්ලෙන්.''

ඔවුහු සෙමින් ගමන් කොට ගොඩනැගිල්ලේ අඩවල් වූ දොර පියන විවර කළෝ ය. ඒ හා ම ශබ්දය ඔවුන්ගේ දෙසවන් බිහිරි කරවන තරමට තීව්‍ර වී ය.

ශාලාවකට නැතහොත් උමගයකට ඇතුළු වූ ඔවුහු දෙනෙත් අඳුරට හුරු වන තෙක් මදක් නතර වූවෝ ය. තමන් පිවිසියේ ගොඩනැගිල්ලකට නොව කඳු බෑවුම තුළට සාරන ලද උමගයකට බැව් දෙපස බැමි පිරික්සූ පීටර් දැන්වී ය. දෑස අඳුරට හුරු වූ පසු උමගය තවත් ඉදිරියට විහිදෙන බැව් ඔවුන්ට පෙනිණ. දෙපස බැමි අල්ලාගෙන ඔවුහු පෙරට ම පා එසවූහ. ප්‍රධාන උමගයෙන්



Scanned with CamScanner

බෙදී යන කුඩා උමං කිහිපයක් ඔවුහු පසු කළෝ ය. ඉදිරියේ තැනකින් නැගෙන ප්‍රබල ආලෝකයක් හේතුකොටගෙන උමගය මද වශයෙන් එළිය වී ය. උමගය ක්‍රමයෙන් පුළුල් ද උස් ද වන බැව් ඔවුන්ට පෙනිණ. ඇතුළත වන ඒකාකාරී ඝෝෂාව මේ වන විට ඔවුන්ගේ දෙසවන් පිරී යන තරමට මහත් ව වැඩී තිබුණේ ය.

උමගයේ වූ නැම්මක් වටා පැමිණි ඔවුහු තමන්ට පියවර කිහිපයක් ඉදිරියෙන් බිම හිඳ දුම්පානය කරන මිනිසුන් කිහිප දෙනෙකු හදිසියේ දර්ශනය කළහ. මිනිසුන්ට තරමක් ඔබින් ප්‍රබල ලෙස ආලෝකමත් වූ විශාල ශාලාවක් ඔවුන්ට පෙනුණේ ය.

"මුර කාරයන් වෙන්ට ඕනෑ" යි කොඳුරමින් පෙරටුව ගමන් කළ ජැක් පසු බැස්සේ ය. "මේ පැත්තෙන් තව දුරටත් යන්ට බැහැ. අපි අතු උමගයක් දිගේ ගිහින් බලමු.

හඬ නොනගා ආපසු ගමන් කළ ඔවුහු දකුණු දෙසට විහිදෙන ශාඛා උමගයකට පැමිණ ඒ ඔස්සේ පා ඔසවන්ට වූවෝ ය. ගබඩා ය යි සිතිය හැකි කුටි කිහිපයක් එහි පසෙක පෙළට සාදා තිබිණ. මද ආලෝකයෙන් යුතු විදුලි බුබුලක් එක් කුටියක දල්වෙමින් තිබුණෙන් ඔවුහු හිස පොවා කුටිය පිරික්සූහ. ලෝහමය පීප්ප කිහිපයක් එහි එක් බැම්මක් අද්දර ගොඩ ගසා තිබුණේ ය. ප්‍රථම කුටියට සම අයුරින් ආලෝකමත් කළ දෙවැනි කුටියෙහි වූයේ පෙට්ටි හා මළු රාශියකි.

"මේ මොනවා වෙන්ට පුළුවන්ද?" යි බිල් විස්මය මිශ්‍රිත බැල්මක් කුටිය සිසාරා හෙළුවේ ය.

"හිතාගන්ට බැහැ" යි පෙට්ටියක පියන විවෘත කරන්නට තැත් කරමින් ජැක් පිළිතුරු දිනි. "සෑම පියනක් ම ඇණවලින් සවි



Scanned with CamScanner

කරලයි තියෙන්නේ"

ඔවුන් කුටියෙන් පිට වන්නට සැරසෙන්නා හා ම උමගයේ ඉහළ සිට පැමිණෙන කිහිප දෙනෙකුගේ බර පා හඬ හදිසියේ ශ්‍රවණය වූයේ ය. මිනිසුන් ඇතුළු වුවහොත් සැඟවිය හැකි ස්ථානයක් එහි නොවූයෙන් ඔවුහු භීතියෙන් ගැහෙන හදින් යුතු ව බැම්මට පිටු පා නිහඬ ව බලා සිටියහ. පා හඬ කුටියේ දොරටුව අසල නතර විය. මිනිසුන් එකිනෙකා සමඟ කථා බහ කරනු ඇසුණේ ය. ඔවුන් කුටියට ඇතුළු වන්නට සැරසෙන්නාක් මෙන් පෙනිණ. ඉක්බිති අදහස වෙනස් කළාක් සේ ඔවුන් යළි පහතට ගමන් කරනු ඇසී ගියෙන් ළමෝ සැනසුම් සුසුමක් හෙළුහ.

"යන්තම් ගැළවුණා." යි සුසුමැලි වූ වතින් යුතු පීටර් මිමිණී ය. "ඉක්මණට මෙතනින් පිට වෙමු."

ඔහු මෙසේ පවසන්නා හා ම පහත සිට පැමිණෙන්නකුගේ පා හඬ යළිත් වරක් ශ්‍රවණය වී ය. මිනිසා කුටිය පසු කොට යතැ යි අපේක්ෂා කළ ද සිදු වූයේ අනෙකකි. උස් සිරුරින් යුතු මිනිසෙක් එහි ඇතුළු වී හිස නොඔසවා ම ගිනි කූරක් දල්වී ය. එය මුවෙහි රඳවාගත් දුම් වැටියකට ළං කළ හෙතෙම දුම් ගුලියක් පිට කරමින් ම හිස එසෙව්වේ ය. ඒ හා ම තමා දෙස එක එල්ලේ බලා සිටි ළමුන් කිහිප දෙනෙකු දුටු ඔහුගේ මුවින් විස්මිත රාවයක් නික්මිණ. දුම්වැටිය ගිලිහී බිම පතිත වී ය. යළි සිහි එළවා ගත් හෙතෙම "ඒයි....! ' යි කිසිවක් කෑගැමට තැත් කළේ ය. ඔහුට කිව හැකි වූයේ එපමණෙකි. ඔහු පිටුපස සිටි ජැක් විසින් එල්ලය බලා ගසන ලද වේගවත් පහරින් මිනිසා කෙදිරියකුදු නොනගා බිම ඇද වැටුණේ ය. යළි නැගී සිටින්ට ද ප්‍රථම සවිමත් දෑත් සතරක ග්‍රහණයට ඔහු නතු විය. කලහයට එක් වූ පස්වැනි දෑතක් සවිමත් කඹයකින් තමා වෙළනු ඔහුට දැනුණේ ය. උස් හඬින් කෑගැමට

තැත් කළ ද ඒ සඳහා පෙණහළු වාතයෙන් පුරා ගන්ට ද මත්තෙන් රෙදි කැබලි කිහිපයක් අයාගත් තම මුවට ඇතුළුවනු ඔහුට දැනුණේ ය. ඔහු දෙනෙත් පුළුල් ව විවර කොට තමා වටා සිටි අධිෂ්ඨානාත්මක මුහුණු පහක් දෙස බැලී ය. තවත් මොහොතකින් ඉහළට ඔසවන ලද මිනිසා කුටියේ අඳුරු මුල්ලක ගොඩ ගැසූ පෙට්ටි කිහිපයක් මත රඳවන ලද්දේ ය.

"එළියට යමු" යි ඩික් කලබල වෙමින් කීවේ ය. "තවත් අය එන්ට බැරි නැහැ"

"යන්ට කලින් මෙතන සිද්ධ වෙන දේ දැනගන්ට ඕනෑ" යි බිල් විරුද්ධ වී ය. "උමගය දිගේ උඩහට යමු."

ඔවුහු කුටියෙන් පිට වී උමගය ඉහළට ගමන් කරන්නට වූවෝ ය. තවත් කුටි කිහිපයක් පසු කළ ද ඒ පිරික්සන්නට ඔවුන් නතර වූයේ නැත. උමගය ක්‍රමයෙන් ඉහළට නැගෙන බැව් ඔවුන්ට ඉක්මනින් ම අවබෝධ වූයේ ය. පියවර සියයක් පමණ ගමන් කළ ඉක්බිති පහතින් වන විශාල ශාලාවකට විවෘත වූ සඳළු තලයක් බඳු ස්ථානයකට ඔවුහු පැමිණියහ. අනතුරු ව නැවතී විස්මයෙන් හයාගත් නෙතින් හා මුවින් යුතු ව ශාලාව දෙස බලා සිටින්නට වූවෝ ය.

ඔවුන් සිටි තැනට අඩි සතළිසක් හෝ පණසක් පමණ පහතින් වූයේ දීප්තිමත් ලෙස ආලෝකමත් කළ අති පුළුල් ශාලාවකි. එහි එක් අන්තයක විදුලිය උත්පාදක යන්ත්‍රයක් ද මැද පෙදෙසේ ඔවුන් විසින් කිසි කලෙකත් නොදක්නා ලද තවත් විශාල යන්ත්‍රයක් ද ක්‍රියා කරමින් තිබිණ. යන්ත්‍ර යුගලයෙන් නැගෙන හඬ එකිනෙක සම්මිශ්‍රණය වීමෙන් දෙසවන් බිහිරි කරවන ඒකාකාරී ඝෝෂාවක් නික්මිණ. ඒ වූ කලී කුඩාරමේදීත් පිටතදීත් තමන් ශ්‍රවණය කළ හඬ

බැව් ළමෝ අවබෝධ කළහ. එහෙත් ඔවුන්ගේ විශේෂ අවධානයට බඳුන් වූයේ සිරුරට සිර වන සේ කෙටි ඇඳුමක් හැඳ කලබලයෙන් ශාලාවේ ඔබ මොබ දිවෙන විසි දෙනෙකුගෙන් පමණ සමන්විත මිනිස් කණ්ඩායමකි. ඇතැමෙකු වඩා විශාල යන්ත්‍රයේ පැති කුහරයකින් නික්මෙන සුදු පැහැති කිසිවක් බඳුන් පුරා රැගෙන පැමිණි අතර තවත් සමහරෙක් විනිවිද පෙනෙන මළුවල ඒ පිර වූහ. මෙසේ සැකසෙන මළු පෙට්ටි තුළ බහා ඇණ ගසා පියන වැසීම තවත් පිරිසකට භාර කොට තිබුණේ ය. යථෝක්ත පිරිස අතර හැසිරුණු මුර භටයන් කිහිප දෙනෙක් විටින් විට කසයෙන් තළමින් අලසයන් ද විඩා හරින්නන් ද වඩා වේගවත් ක්‍රියාකාරිත්වයකට මෙහෙය වූහ. ළමුන් විසින් විටින් විට දක්නා ලද තරබාරු මිනිසා ශාලාවේ මැත කොණක වූ සුව පහසු අසුනක හිඳ කම්හලේ කටයුතු සිදු වන ආකාරය පිරික්සී ය.

'කර්මාන්ත ශාලාවක්' යි පීටර් විස්මයෙන් කොඳුළේ ය. "මොනවද ඔය හදන්නේ?"

"පෙනෙන්නේ නැද්ද?' යි ජැක් පිළිතුරු දිනි. "මේක මත් ද්‍රව්‍ය නිෂ්පාදනාගාරයක්. අර මැද තියෙන්නේ ඒවා අඹරන යන්ත්‍රයයි. ඒකෙන් සෑදෙන මත් කුඩු අර මිනිස්සු අසුරා ගබඩා කරනවා. කම්කරුවන්ගෙන් වැඩ ගන්නේ වහලුන්ගෙන් වගෙයි."

හදිසියේ ම ළමුන් පසුකොට පැමිණි උමගයේ පහතින් මිනිසුන් කිහිප දෙනකු උස් හඬින් කථා කරන හඬ ඇසිණ. ඊට ස්වල්ප වේලාවකට පසු මුර සෙබළුන් දෙදෙනකු පෙරටු කොටගෙන ප්‍රධාන ශාලාවට පිවිසි උස එකෙක් තරබාරු මිනිසා අසල නතර විය. ඒ අනිකකු නොව තමන් විසින් උමගයේදී පහර දී බැඳ දමන ලද මිනිසා බැව් ළමෝ වහා හැඳිනූහ. තරබාරු මිනිසාත් සෙස්සනුත් අතර කෙටි සංවාදයක් හටගති. ඉතික්බිති පළමුවැන්නා හූනස්තෙන්



Scanned with CamScanner

නැගී කිසි විධානයක් නිකුත් කළෙන් උමගයේ කිහිප තැනකින් අනතුරු හඟවන නලා නද දෙනු ශ්‍රවණය වී ය. කම්කරුවන් අතර සිටි මුර සෙබළු වහා හැරී ප්‍රධාන උමගය දෙසට දිවෙන්නට වූවෝ ය.

"ඔවුන් කලබල වෙලා අප සොයන්ට යනවා" යි ජැක් කොඳුලේ ය. "අපි දැන් මොකක්ද කරන්නේ?"

මේ මොහොතේ ඔවුන් සිටි අතුරු උමගයේ පහළින් මිනිසුන් කිහිප දෙනෙකු වේගයෙන් ඉහළට දිවෙන හඬ ඇසුණේ ය.

"ඔවුන් එන්නේ මේ උමගය දිගේ" යි ජිම් කලබල විය. "අපට මේ පැත්තෙන් ආපහු පලා යන්ට බැහැ"

"ඔව්. අපි උඩහට දුවමු" යි ජැක් පෙරමුණ ගත්තේ ය. "නමුත් කිසි කෙනෙක් එකිනෙකාගෙන් වෙන් වෙන්ට එපා."

පහත ශාලාවේ ආලෝකය හේතුකොටගෙන මඳ වශයෙන් අඳුර බිඳී පැවති උමගය ඉහළට ඔවුන් දුවන්නට සැරසෙත් ම එහි පහත නැම්මක් වටා සෙබළුන් කිහිප දෙනෙක් හදිසියේ මතු වූහ.

"අන්න දුවනවා" යි එකෙක් කෑගැවේ ය. "ලුහුබඳිමු"

"නැවතියව්" යි තවෙකෙක් ගුගුළේ ය. "දිව්වොත් වෙඩි තියනවා"

එහෙත් ඔහු තුවක්කුව ඔසවන්ට ද ප්‍රථම උමගයේ ඉහළින් වූ තවත් නැම්මක් වටා ළමෝ අතුරුදන් ව සිටියහ.

"නවතින්ට එපා" යි ඉදිරියට ම දිවෙමින් ජැක් කෑගැවේ ය.

ළමුන්ගේ තරුණ දෙපා ද පසු පසින් ඇදෙන අන්තරාය පිළිබඳ අවබෝධය ද ඔවුන් වේගයෙන් පෙරට ම මෙහෙය වූයෙන් ලුහුබඳින්නන්ගේ හඬ වඩ වඩා ඈත් ව ඇසෙන්ට වී ය. සෙබළුන්ගේ බර පාවහන්වලට එරෙහි ව ළමුන්ගේ රබර් අඩි ගසන ලද සැහැල්ලු පාවහන් ඔවුන්ට වැඩි වේගයක් ගෙන දුන්නේ ය. එනමුදු ලුහු බඳින්නන්ගේ හඬත් කැකෝ ගසන හඬත් නොනැවතී පසු පසින් ශ්‍රවණය වී ය.

උමගය තුන් දෙසකට බෙදෙන මංසන්ධියකට ඔවුහු පැමිණියහ. මේ වන විට ඝන අන්ධකාරය ඔවුන් වෙළා තිබුණෙන් ජැක් විදුලි පන්දම දල්වා අවට පිරික්සී ය.

"අපි මෙතනින් කොයි පැත්තට හැරෙමුද?" යි ඩික් විචාළේ ය.

"දකුණට යමු" යි පීටර් කී ය. අපි හැරුණු දිශාව සතුරන්ට දැනගන්ට බැරි වෙයි. බිම කළු ගලෙන් හැදිල තියෙන නිසා අපේ පා සටහන් ඔවුන්ට දැකගන්ට බැහැ."

ඔවුහු හැරී දකුණු දෙසට විහිදෙන උමගය ඔස්සේ දුවන්නට වූහ. රබර් අඩි සහිත පාවහන් හැඳ සිටි ඔවුන්ගේ පා ගැටෙන හඬ දෝංකාර නැංවූයේ නැත.

"ටිකකට නතර වෙමු." යි පියවර සියයක් පමණ ගමන් කළ ඉක්බිති ජැක් කොඳුළේ ය. "සමහර විට මිනිස්සු මේ උමගය දිගේ නොඑන්ට බැරි නැහැ. කඳු ඇතුළේ තියෙන මෙහෙම උමං දිගේ දිශාව නොදැන දිව්වොත් අතර මං වෙන්ට පුළුවනි."

ඔවුහු නතර වී සවන් යොමුවෝ ය. මිනිසුන් මංසන්ධිය අසලට පැමිණෙනු ද එහි නතර වී එකිනෙකා සමඟ සාකච්ඡා කරනුද ඇසිණ. තවත් මොහොතකින් ඔවුහු කණ්ඩායම් වශයෙන් බෙදී තුන් දෙසට විසිරී යනු ශ්‍රවණය වී ය.

"දෙන්නෙක් අපේ උමගයට ඇතුල් වුණා." යි මිනිසුන්ගේ පා හඬට සවන් යොමමින් බිල් කොඳුළේ ය. "ඉදිරියට යනවා හැරෙන්ට වෙනත් කළ යුතු දෙයක් අපට නැහැ."

යළිත් වරක් පෙරට ඇදෙන්ට වූ ඔවුහු මිනිත්තු කිහිපයකට පසු තවත් තුන් මංසන්ධියකට පැමිණියෝ ය. මෙවර ඔවුහු වම් පසට හැරී ගමන් කරන්නට වූහ. උමගය සීඝ්‍ර නැග්මක් සහිත වූයෙන් ගමන පෙරට වඩා අසීරු විය. එහි වහළය ඉතා පහත් බැව් විදුලි පන්දමේ ආලෝකයෙන් ඔවුන්ට පෙනිණ. ඇතැම් තැනක ඒ කෙතෙක් පහත් වී ද යත් හිස නවාගෙන ගමන් කිරීමට ද ඔවුන්ට සිදු විය.

හදිසියේ ම උමගය උස් වූ වහළයකින් හෙබි විශාල ස්වාභාවික කුටියකින් කෙළවර වූයේ ය. පැති බැම්ම කෙතෙක් පිරික්සුව ද තවත් ඔබ්බට ගමන් කළ හැකි විවරයක් එහි නොවූයෙන් ළමෝ අධෛර්යයට පත් සිතින් එකිනෙකා දෙස බැලූහ.

"අපි කොටු වුණා" යි ඩික් දොම්නස් ස්වරයෙන් මිමිණී ය. "අනිත් උමඟ පරීක්ෂා කළාට පස්සේ ඔවුන් මෙහාටත් ඒවි."

"අපි මොකක්ද කරන්නේ?" යි ජිම් විමසී ය.

"කරන්ට දෙයක් නැහැ.' යි බැම්මට පිට දී බිම හිඳගනිමින් ජැක් පිළිතුරු දුන්නේ ය. "මෙතන ම රැඳිලා එන ඕනෑ ම දේකට



Scanned with CamScanner

මුහුණ දෙමු. අනික, දැන් අපට ආපහු පාර සොයාගන්ට බැහැ. අපි උමං ජාලයේ අතර මං වෙලා."

"දැන් වෙලාව කීයද? " යි ඩික් ඇසී ය.

"රෑ දොළහත් පහු වෙලා" යි විදුලි පන්දමේ ආලෝකයෙන් ජැක් ඔරලෝසුව පිරික්සී ය. මද නිහැඩියාවක් ඔවුන් අතර පැතිරිණ.

"ඔය ගොල්ලන්ට මෙතන අමුත්තක් තේරෙන්නේ නැද්ද?" යි බිල් හදිසියේ ප්‍රශ්න කළේ ය.

"කොහොම අමුත්තක්ද?"

"දැන් බලන්ට. අපි ඉන්නේ කම්හල තිබුණු ප්‍රධාන ශාලාවෙන් බොහොම ඈත. ඒ නිසා ඒකෙ ආලෝකය මේ තරම් දුර විහිදෙන්ට බැහැ. මෙතන තියෙන්ට ඕනැ ඝන අන්ධකාරයක්. නමුත් මේ කුටිය ඒ හැටි කළුවර නැති වග පෙනෙන්නේ නැද්ද?"

ඔහු විසින් පවසන ලද්දේ සත්‍යයකි. මන්ද යත් එකිනෙකාගේ ඡායාව යන්තමින් වුව දර්ශනය කළ හැකි තරමේ මද අලෝකයක් කුටිය පුරා පැතිරී තිබුණු හෙයිනි.

"ඒ හැරෙන්ට මෙතන හොඳ වාතාශ්‍රයක් තියෙනවා" යි පීටර් කීවේ ය. "ඔය වාතයත් ආලෝකයත් ඇතුළු වන තැනක් තියෙන්ට ඕනැ."

හිඳ සිටි තැනින් නැගී අවට බැම් මැනවින් පිරික්සූ මුත් වාතයටත් ආලෝකයටත් වග කිව හැකි සිදුරක් ඔවුන්ට දකගත නොහැකි වී ය.



Scanned with CamScanner

"පොළොවට අඩි හතක් විතර ඉහළින් කුටියේ බැම්ම වටේ පුළුල් ගල් වැටියක් ඇතුළට නෙරලා තියෙනවා පෙනෙනවාද?" යි විදුලි පන්දමේ ආලෝකය ඉහළට යොමු කරමින් ජැක් ප්‍රශ්න කළේ ය. "ඒ වැටිය නිසා ඊට ඉහළ බැම්මේ විශාල කොටසක් ආවරණය වෙලා. එතනට නැගගන්ට හැකි වුණොත් බැම්ම තවත් හොඳින් පරීක්ෂා කරන්ට පුළුවනි. පීටර්, මගේ බර දරාගන්ට පුළුවන්ද?"

"පුළුවනි. නගින්ට" යි පීටර් නැවී තම උරය අතිකා හට පෑවේ ය.

"හේයි ! අපි අවාසනාවන්ත නැහැ" යි පීටර්ගේ උරය මතින් ගල් නෙරුමට නැගගත් ජැක් ප්‍රීතියෙන් මොර දෙන්ට වූයෙන් සෙස්සෝ වහ වහා ඔහු දෙසට හැරුණාහ.

"වාතයත් ආලෝකයත් ඇතුළතට වදින්නේ මෙතන බැම්මේ තියෙන තරමක් විශාල කුහරයකින්. ගල් වැටිය නිසා ඒක පහළට පෙනෙන්නේ නැහැ. අහස බොහොම පැහැදිලියි. හඳ එළියෙන් මුළු පරිසරය ම ආලෝකමත් වෙලා. ඉක්මනට උඩට නගින්ට."

ඔහු ගල් බැම්ම මත වැතිර දෑත දිගු කොට සෙස්සන් එකිනෙකා බැගින් ඉහළට එසෙව්වේ ය. ඉක්බිති සියල්ලෝ ම බැම්මේ වූ කුහරය අසලට රැස් වූහ.

ඒ, වැඩුණු මිනිසකු හට පහසුවෙන් රිංගා ගත හැකි තරම් පුළුල් කුහරයකි. පිටතින් වන ආකාශය මුදුන් වූ සඳුගේ කිරණින් ඝන නිල් පැහැයක් ගෙන තිබුණේ ය. සන්ධ්‍යාවෙහි දක්නා ලද එක ද වළාවක් හෝ පෙනෙන්නට නොවී ය. අතරින් පතර පෑයූ තාරකා කිහිපයක් චන්ද්‍රාලෝකයේ ප්‍රබලත්වය හේතුකොටගෙන දිස් වූයේ අල්පෙනිති තුඩු පරිද්දෙනි. ඔවුන් සිටි තැනට පහතින් සරුවට



Scanned with CamScanner

වැඩුණු මහ වනය අඳුරු සෙවණැල්ලක් සෙයින් පෙනුණේ ය. එහි තන් තන්හි විවෘත බිම් කිහිපයක් සඳ එළිය වැද පැහැදිලි ව දර්ශනය වී ය.

"අපි ඉන්නේ කඳු බෑවුමක " යි කුහරය තුළට වැදුණු ජැක් පිටතට හිස යොමමින් කීවේ ය.

මේ මොහොතේ පහත උමගය දෙසින් මිනිසුන් කථා කරන හඬ ඇසිණ. විදුලි පන්දම් ආලෝකයක් උමගය ඔස්සේ කුටිය දෙසට පැමිණෙනු ඔවුන්ට පෙනුණේ ය. තවත් මොහොතකින් ආලෝකය පසු පසින් පැමිණි මිනිසුන් දෙදෙනෙක් කුටියට පිවිස නතර වූහ.

"මේ කොල්ලො කොහේ ගියා ද?" යි පන්දම අතැති ව සිටි මිනිසා එහි ආලෝකය කුටියේ බැම් සිසාරා එල්ල කළේ ය. "මේ උමගය මෙතනින් කෙළවර වෙනවා."

"අනිත් හැම උමගයක් ම අපි පරීක්‍ෂා කළා. කොල්ලන්ගේ ලකුණක්වත් පෙනෙන්ට නැහැ."

"ආපහු යමු" යි කියමින් අඩක් හැරුණු පළමුවැන්නා පන්දමේ ආලෝකය ගල් තෙරුම දෙසට එල්ල කළේ ය. ළමුන් බෑම්ම මත වැතිර සිටි හෙයින් ඔහුට ඔවුන් පෙනුණේ නැත. එහෙත් හෙතෙම,

"කොල්ලො අර ගල් තෙරුමට නැග්ගාවත්ද?" යි නතර වූයේ ය. "උඩට නැගලා බලමු."

තමන්ගේ හෘදය ස්පන්දනය නතර වූවාක් මෙන් තෙරුම මත වැතිර සිටි ළමුන්ට දැනුණේ ය. ඒ හා ම දෙවැන්නාගේ

කථාවෙන් ඔවුන්ට මඳ සහනයක් ඇති විය.

"එලක් නැහැ" යි මිනිසා කීවේ ය. "ඕකට නගින්ට ඔය කොල්ලන්ට බැහැ. අනික, එළියක් නැති ව ගල් තෙරුම ඔවුන්ට පෙනෙන්නේ නැහැ. මෙලහකටත් ඔවුන් උමගෙක අතර මං වෙලා ඇති."

"යන්තම් ගැළවුණා." යි බිල් එතෙක් මැඩලා සිටි සුසුමක් සෙමින් පිට කළේ ය. "මම නම් හිතුවේ අපි අහු වුණා ම කියලයි."

ඔවුහු එකිනෙකා පසුපස කුහරයට වැදී කඳු බෑවුමකට සම්ප්‍රාප්ත වූවෝ ය. තමන් බිම් මට්ටමින් අඩි තුන් සියයක් තරම් ඉහළින් සිටින බැව් ඔවුහු දුටහ.

"අර පහළින් පෙනෙන තැනිතලාව මම දන්නවා" යි කඳු පාමුල ආසන්නයේ පිහිටි විවෘත බිම් කඩක් දක්වමින් ජිම් කීවේ ය. "මම නිතර ම බැටළුවන් එතනට ගෙනෙනවා. අපි දැන් ඉන්නේ කඳවුරු කන්දට යා ව තියෙන කන්දේ බෑවුමක. පහළට යන මගක් මම දන්නවා. යමු."

ජිම් පෙරටුකොටගෙන සිව් මිතුරෝ වහ වහා බෑවුම බැස තැනි බිමට පිවිසියෝ ය.

"අර මත් ද්‍රව්‍ය කම්හල ගැන අපි පොලීසියට කියන්ට ඕනෑ" යි ජිම් දෙස බලමින් ජැක් දන්වී ය.

"නමුත් මේ කිට්ටුවක පොලිසියක් නැහැ" යි ජිම් විරුද්ධ විය.

"තියෙන තැනක් හොයාගෙන ගිහින්වත් කියන්ට ඕනෑ."

"එහෙනම් විල් මුණගැහෙන්ට යමු. ඉඳ හිටලා නගරෙට යන නිසා පොලිසියක් ගැන එයා දන්නවා ඇති."

ඔවුන් විල්ගේ කම්මලට පැමිණෙන විටත් රාත්‍රී අන්ධකාරය පහ ව තිබුණේ නැත. ළමුන්ගේ හඬ ගැමෙත් අවදි වූ විල් විදුලි පන්දමක් ද අතින් ගෙන පිටතට බැස්සේ ය.

"ඇයි? ඇයි? මොකද කලබලේ? කරදරයක්වත්ද?"

තමන්ගේ රාත්‍රී වික්‍රමය පිළිබඳවත් මත් ද්‍රව්‍ය නිෂ්පාදනාගාරය පිළිබඳවත් ළමෝ අනිකා හට විස්තර කළෝ ය. 'ඉතින් මේ ගැන ඉක්මනින් ම පොලිසියට කියන්ට ඕනෑ" යි ජැක් කථාව අවසන් කරමින් දන්වී ය.

'මේ කිට්ටුව නම් පොලිසියක් නැහැ." යි විල් කීවේ ය. 'කිට්ටුව පොලිසියට හැතැප්ම විස්සක් විතර යන්ට ඕනෑ."

"ඒ තරම් දුරක් කොහොම යන්ටද? " යි පීටර් කණස්සලු වී ය. "වාහනයක් තිබුණා නම්.........."

"හරි. මගේ අශ්වයා පිටේ යමු" යි විල් යෝජනා කළේ ය. "නමුත් මා එක්ක යන්ට පුළුවන් එක් කෙනෙකුටයි. නගරෙට යන්ට කෙටි කැලෑ පාරක් මම දන්නවා. අපි ආපහු එන කම් අනිත් අයට පුළුවනි කම්මලේ නවතින්ට.".

"නැහැ. අපි කඳුවුර ඉදිරිපිට වන ලැහැබේ සැඟවිලා ඉන්නම්" යි ඩික් කීවේ ය. 'සතුරන් කරන දේ අපට පුළුවනි බලාගන්ට."



Scanned with CamScanner

තවත් ස්වල්ප වේලාවකින් ම ජැක් තමා පිටු පසින් නංවාගත් විල් ආසන්නතම නගරය බලා පිටත් වූ අතර සෙස්සෝ කඳවුර දිශාභිමුඛ ව පා ඔසවන්නට වූවෝ ය.

*　　*　　*　　*

කඳවුර තුළ කලබලයක සලකුණකුදු පෙනෙන්ට තිබුණේ නැත. ළමුන් විසින් ඉකුත් රාත්‍රියෙහි විවෘත කොට තබන ලද කඩුල්ල ඒ වන විටත් අගුල් ලා තිබුණු අතර ළමුන් පෙර කිහිප වරක් දැක හුරු පුරුදු නියමුවා ඒ අසල සිට මුර භටයා සමඟ සාකච්ඡාවක යෙදී සිටියේ ය. උදැසන නිහඬ වා තලය හරහා ඔවුන්ගේ කට හඬ වන සීමාව අද්දර සැඟ ව හුන් ළමුන් කරා පැහැදිලි ව ගලා ආවේ ය.

"ඔය කොල්ලො කඳවුරට ඇතුලු වුණේ කොහොම ය කියලද තමුසෙ හිතන්නේ?" යි ගුවන් නැවියා විමසී ය.

"වෙන කොහොමද කඩුල්ලෙන් ම වෙන්ට ඕනෑ. මම අද උදේ එද්දි ඒක ඇරලයි තිබුණේ."

"නමුත් විදුලි කාන්දුව?"

"ඊයේ මුරට හිටියේ ජේම්ස්. විදුලි ලීවරය අදින්ට මිනිහට අමතක වෙන්ට ඇති."

"කඩුල්ලත් ඇර දමා තිබුණා ය කියන්නේ."

"උදේ කිරි ගත්තට පස්සේ ඒක අගුල් දමන්ටත් ජේම්ස්ට අමතක වෙන්ට ඇති. එයාට තද දඬුවමක් දෙන බවට ලොක්කා



Scanned with CamScanner

තර්ජනය කළා.''

'ඔය කොල්ලන්ට මොකක් වෙන්ට ඇද්ද?'' යි මොහොතක් නිහඬ ව සිටි තියමුවා ප්‍රශ්න කළේ ය. 'ඔවුන්ගේ සලකුණක්වත් හොයාගන්ට බැරි වුණා.''

''උමං ජාලයේ අතර මං වෙන්ට ඇති. වෙන මොකක් වෙන්ටද? මෙලහකටත් හාමත් වෙලා කොහේ හරි වැටිලා ඇති. අනුන්ගේ තැන්වලට රිංගනවාට යස පාඩම.''

මේ මොහොතේ තරබාරු මිනිසා ගොඩනැගිල්ලකින් පිට වී යානය දෙසට පැමිණෙන්ට වූයෙන් තියමුවා එහි නැග යන්ත්‍ර පණ ගැන්වී ය. තවත් ස්වල්ප වේලාවකින් ගුවන් ගත වූ හෙලිකොප්ටරය ආකාශයේ කුඩා ලපයක් තරමට කුඩා වී ඉක්බිති මුළුමනින් අතුරුදන් වී ය.

උදෑසන එකොළහ පමණ වන විට සූර්‍ය තාපය ක්‍රමයෙන් දැඩි වූයේ ය. වන ලැහැබේ සෙවණේ රැඳී සිටිය ද අඛණ්ඩ ව හමන්නට වූ උණුසුම් සුළඟ ළමුන්ගේ විඩාපත් ගතට මහත් වධයක් ම වී ය.

''හෙලිකොප්ටරයක ශබ්දය ඇහෙනවා'' යි තුරු මුදුන් අතරින් පීටර් නිල් ආකාශය පරීක්ෂා කළේ ය. ''ඔව් අර පෙනෙන්නේ''

කුඩා ලපයක් සෙයින් ඈතින් පෙනුණු හෙලිකොප්ටර් යානයක් ක්‍රමයෙන් විශාල වෙමින් කඳවුර දෙසට පහත් වන්නට වී ය.

''කඳවුරේ යානය වෙන්ට ඕනෑ'' යි ඩික් අනුමාන කළේ ය.



Scanned with CamScanner

කඳවුර තුළ සක්මන් කරමින් සිටි මුර භටයාට ද යානයේ හඬ ශ්‍රවණය වූ බැව් පෙනී ගියේ සක්මන මදකට නතර කොට විමසුම් දෙනෙතින් ඔහු ආකාශය පිරික්සන්නට වූ හෙයිනි. තවත් මොහොතකින් යානය පැහැදිලි ව පෙනෙන තරමට පහත් විය. එහි බඳෙහි POLICE යන්න විශාල අකුරින් සටහන් කොට තිබුණේ ය.

යානය දැකීම ළමුන්ගේ අධික ප්‍රීතියට හේතු වූ මුත් මුර භටයා කෙරෙහි නම් ඒ ප්‍රතික්‍රියා කළේ හාත්පසින් වෙනස් ආකාරයකිනි. උරයෙහි රඳවාගෙන සිටි ගිනි අවිය පසෙක හෙළු හෙතෙම කිසිවක් උස් හඬින් මුරගාමින් කඳවුර තුළට දුවන්නට වූයේ ය. ඊට ස්වල්ප වේලාවකට පසු ප්‍රථමයෙන් එක් යානයක් ද ඉක්බිති දෙවැන්නක් හා තෙවැන්නක් ද කඳවුර මධ්‍යයෙහි නතර කළෙන් ඒවායින් පිටතට බට පොලිස් භටයන් ගණනාවක් කඳු උමගයට පිවිසෙන ද්වාරය අබියස පෙළ ගැසුණාහ. මේ අතර උසස් පොලිස් නිලධරයකු පසුපසින් ඇති ව තෙවැනි යානයෙන් පිටතට පිනූ ජැක් ප්‍රීතිමත් සිනහවක් පාමින් ස්වකීය සගයන් දෙසට දුවන්නට වූයේ ය.

*    *    *    *

මෙපරිද්දෙන් ලොව පුරා රටවල් ගණනාවකට ම මත් ද්‍රව්‍ය සැපයූ මහා පරිමාණ මත් ද්‍රව්‍ය නිෂ්පාදනාගාරයක් සිව් මිතුරන්ගේ වීරත්වයත් අප්‍රතිහත ධෛර්යයත් හේතුකොටගෙන නීතියේ රැහැනට හසු විය. කඳවුරේ සිටි මුර භටයන්ගෙන් කිහිප දෙනෙක් පොලිස් නිලධාරීන් උමගයට ඇතුලු වීමත් සමඟ ම පෙරට විත් භාර වූහ. සෙස්සන් උමං ජාලයට පලා ගොස් සැඟ වූ මුත් පුළුල් මෙහෙයුමකින් ඉක්බිති ඔවුහු ද අත් අඩංගුවට පත් වූවෝ ය. හෙලිකොප්ටරයේ ගමන් බිමන් ගිය තරබාරු මිනිසා ව්‍යාජ ගුවන්



Scanned with CamScanner

කඳවුරේ පාලකයා පමණක් බවත් නිෂ්පාදනාගාරය සත්‍ය වශයෙන් මෙහෙයවන ලද්දේ රටේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකු විසින් බවත් පසු ව හෙළි වූ අතර ඔවුන් ද නීතියේ රැහැනට හසු කොට ගැනීම කිසි සෙයිනුත් අපහසු වූයේ නැත.

"එතකොට නිෂ්පාදනාගාරයේ වැඩ කළ කම්කරුවෝ කව්ද?" යි ප්‍රධාන පොලිස් නිලධරයාගේ මේසය අබියස අසුනක හිඳ සිටි පීටර් ප්‍රශ්න කළේ ය. "ඔවුන් කැමැත්තෙන් වැඩ කළ බවක් පෙනුණේ නැහැ."

"ඔව්. පසු ගිය කාලය ඇතුළත රටේ විවිධ ප්‍රදේශවලින් මිනිසුන් විශාල ගණනක් අබිරහස් විධියට අතුරුදන් වුණා. ඔවුන්ට සිදුවුණ දෙයක් අපට සොයාගන්ට ලැබුණේ නැහැ. මේ විධියට පැහැරගෙන ආ මිනිසුන් නිෂ්පාදනාගාරයේ වහලුන් වශයෙන් වැඩට යොදාගෙන තියෙනවා. ඔය දරුවන්ට ස්තුතිවන්ත වෙන්ට දැන් ඒ හැමෝ ම නිදහස්.

*　　*　　*　　*

සිව් මිතුරන්ගේ වික්‍රමය ජන මාධ්‍ය මගින් පුළුල් ලෙස ප්‍රචාරය වීමත් සමඟ ම ඔවුන් පැසසුමට ලක් කරමින් ලොව නන් දෙසින් සුබ පැතුම් ගලා එන්නට වී ය. ඉන් එකක මෙසේ සඳහන් කොට තිබුණේ ය.

*""සමස්ත මානවයාගේ යහපත උදෙසා කරන ලද සේවය වෙනුවෙන් ලොව සියලු ම දෙමාපියන්ගේ ගෞරව ප්‍රණාමය පුංචි වීරයන් හට මෙසේ පළ කොට සිටින්නෙමු.""*

නිමි.



Scanned with CamScanner

''නා නා වර්ණයේ සුන්දර මලින් [illegible] ගත්
පඳුරින් යුතු පුළුල් තැනිතලාවක්
ඔවුන් අභියස වෙයි.
ඒ හරහා ගලන්නා වූ ශාන්ත දියෙන් යුතු
පුළුල් දොළ පාරක්
තැන්නේ ඈත අන්තයෙන් ඇරඹී,
ක්ෂිතිජය තෙක් අඛණ්ඩ ව විහිදෙන
ගොහොරු බිමක
සුළඟින් සැලෙන පන් පඳුරු අතර
සැඟ ව යයි.
යථෝක්ත දොළ පාරේ ඉවුරු අසබඩ වැඩුණු
රුක් ගොමුවල අඳුරු ඡායාව
නිසල දිය මත සුන්දර රටා මවන්නේ ය.
රමණීය භූමි භාගය දුටු සිත්තරුකුගේ
තෙලි තුඩින් වර්ණ ගැන්වුණු
දර්ශනීය චිත්‍රයක් [illegible]''

